


# නැගෙනහිර සිංහල උරුමය



අම්පාර දිස්ත්‍රික්කයේ දීඝවාපි දගැබ



ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවේලියේ පැරණි බෞද්ධ ආරාමයක්
කැණීමේදී හමුවු බුදුපිළිම හිස්

# පෙරවදන

පසුගියද මධ්‍යවලට ප්‍රකාශයක් කළ නව නාසිවාදී දෙමළ කොටි සංවිධානයේ න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංගම් ප්‍රකාශ කලේ ලංකාවේ අද ඇත්තේ ජාතික ගැටළුවක් හෙවත් ජාතීන් දෙකක් අතර ගැටළුවක් බවයි. ඔහුට අනුව ලංකාවේ ගැටුම උතුරු - නැගෙනහිර ගැටළුව, සුළු ජාතික ප්‍රශ්ණය, ජනවාර්ගික ගැටළුව ආදී වදන්වලින් හැඳින්විය නොහැක. එමෙන්ම එය අසාධාරණයට ලක්වූ සුළු ජනවර්ගයක දුක් ගැනවිල්ලක් නොවේ. විවිධ න්‍යායකරුවන් පෙන්වාදීමට උත්සාහ කරන පරිදි ලංකාවේ දෙමළ ජනයා වර්ගයක්, ජනවාර්ගයක් හෝ ජාතිකත්වයක්ද නොවේ. එය වෙනම ජාතියකි. එයට වෙනම ඓතිහාසික නිජ බිමක් ඇත. එයට වෙනම භාෂාවක් හා සංස්කෘතියක් ඇත. එයට වෙනම හමුදාවක්, පොලිසියක්,අධිකරණ පද්ධතියක් ඇත. වෙනම බැංකු පද්ධතියක් හා රේගුවක්ද ඇත්තේය. වෙනම රාජ්‍ය පරිපාලනයක් හා රාජ්‍ය මාධ්‍ය ජාලයක්ද ඇත. කොටින්ම තමිල් ඊළම් නමින් වෙනම රාජ්‍යයක් ද දන් ඇත. මේ නිසා අනාගතයේ එළැඹෙන ඕනෑම විසඳුමක් වනාහි වෙන්වී ඇති ශ්‍රී ලංකාව හා තමිල් ඊළාමය එක්කරන සහ සන්ධිය හෝ සන්ධිය වර්ගයේ එකකි. පසුගිය වකවානුව තුල ජාත්‍යන්තර නීතිය යටතේ වෙනම රාජ්‍යයන් බවට පත්වූ බොස්නියාව, ක්‍රොඒෂියාව, එරිත්‍රියාව, නැගෙනහිර ටිමෝරය ආදී රටවල් වෙනම ජාතික රාජ්‍යයන් වීමට සම්පූර්ණ කළ කොන්දේසි සියල්ලම තමන් සම්පූර්ණ කර ඇති බව දන් කොටි සංවිධානයේ මතයයි.

දන් ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවත්, ලංකා ආණ්ඩුවත් කළයුත්තේ එය පිළිගැනීමයි. බාලසිංහම්ගේ ප්‍රකාශයන් කෙසේ වෙතත් පසුගිය සියවස පුරා ඇදී ගිය වෙනම දෙමළ රාජ්‍යයක් පිළිබඳ සංකල්පය අත්තවරදටත් වඩා බලවත් ලෙස සිංහලයන් හා ලාංකිකයන් මත පැටවීමේ දවැන්ත යුධ - දේශපාලනික - ආර්ථික හා සමාජ ක්‍රියාවලියක් දන් දියත්වී ඇත. එළැඹෙන ඉදිරි මාස කීපය තුල වසර දසදහස් ගණනක් එකරටක්, එක නීතියක්, එක ජාතියක් ලෙස පැවැතුනු ශ්‍රී ලංකාව දෙකඩවීම හා අවසාන ලෙස යටත් වී අවසානවීමේ ඉම කරා දන් පැමිණ ඇත. මුදලට හෝ වෙනත් වාසි සඳහා කටයුතු කරන මහානායක හිමිවරු ප්‍රමුඛ සියලු ජනමාධ්‍ය හිමිකරුවන් හා ඇතැම් මාධ්‍යවේදීන් මේ භයානක තත්වය සිංහලයන්ට වසන් කරමින් ඔවුන්ගේ දෑස් අන්ධකර, දෙසවන් සාම ඝෝෂාවලින් බිහිරි කර ඇත.

දෙමළ ජනවර්ගවාදය පසුගිය සියවස තුළ අවධි තුනක ගමන් කළේය. 1910 - 1931 වකවානුව තුළ පොන්නම්බලම් රාමනාදන් - අරුණාචලම් දෙබෑයන් විසින් උත්සාහ කලේ ලංකාවේ දෙමළ ජනයා නවීන ජාතිය බව පෙන්වාදී ඉංග්‍රීසින්ගෙන් පසු සමස්ත ලංකාවේම පාලනය දෙමළ මහා ජාතිය යටතට ගැනීමටය. 1931 - 49 වකවානුවේ ජී.ජී. පොන්නම්බලම් උත්සාහ කලේ රාජ්‍ය බලයේ බහුතරය හෝ අඩුතරමින් සමාන කුට්ටියක් කඩා ගැනීම සඳහාය. මේ සියළු ප්‍රයත්න අවලංගු වූ විට ඔවුන් තුන්වෙනි අවධිය කරා ගෙනගියේ එස්.ජේ.වී. චෙල්වනායගම් හා ඔහුගේ පක්ෂය වූ දෙමළ රාජ්‍ය පක්ෂය විසිනි.

**1949 දෙසැම්බර් 18 ද එම පක්ෂය බිහිවූ දත්, 1951 එම පක්ෂයේ සම්මේලනයේදීත් වෙනම රාජ්‍ය සංකල්පය විධිමත් ලෙස ඉදිරිපත්කරනු ලැබිය. ඒ අනුව........"ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර දෙපළාතෙහි ස්වාධීන දෙමළ රාජ්‍යයක් වසර දහස් ගණනක සිට පැවැතුණු අතර එය ඔවුන්ගේ ඓතිහාසික නිජබිමයි. එහි දෙමළ නමින් වෙනම ජාතියක් ජාතියක් වීමට අවශ්‍ය සියළු අංග සම්පූර්ණ කරගෙන වාසය කරති. ඔවුනට එහි වෙනම රාජ්‍යයක් බිහිකර ගැනීමේ ජාතික හා ජාත්‍යන්තර නීතිමය අයිතිය හෙවත් ස්වයං නිර්ණය පිළිබඳ අයිතියක් ඇත. වතු දෙමළ ජනයාද මේ අනන්‍ය දෙමළ ජාතියේ කොටසකි." ආදී ලෙසය. විසඳුම ලෙස චෙල්වනායගම් මුලින්ඉදිරිපත් කලේ ලංකාවේ දෙමළ ඊළම් ඉන්දියාවට එක් කර සන්ධීය -පෙඩරල් - රාජ්‍යයක් බිහිකිරීමටය. ඉන්දියාවේ (නේරු) විරෝධය නිසා පසුව ලංකාව සමග සන්ධීය -එක්සත් -පෙඩරල් -රාජ්‍යයක්ඇතිකර ගැනීම ගැන යෝජනා කළේය. ඒ අනුව ඔවුන් පෙඩරල් ක්‍රමය යෝජනාකළේ යුරෝපයේ මෙන්ම රාජ්‍යයන් එක්කරගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙසය.**

දන් බාලසිංගම් හා ප්‍රභාකරන් යෝජනා කරන්නේද එයමය.

ප්‍රභාකරන් හා ඔහුගේ කොටි ත්‍රස්තවාදය රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව බලයට ගෙනආවේ සිය අවසාන ජයග්‍රහණය ඉලක්ක කරගෙනය. ඔවුන්ගේ දේශපාලන ඉලක්කය උතුරු හා නැගෙනහිර දෙමළ ඊළම බිහිවෙද්දී දකුණේ බෙදීගිය අස්ථාවර දුර්වල පාලනයක් පැවැතීමයි. ඔහු ඊනියා සටන්විරාම ගිවිසුමට පිවිසුනෙත් පසුගිය කාලය තුල සීඝ්‍රයෙන් එය තුළ ක්‍රියාත්මකවූයේත් අරමුණු කිහිපයක් මුදුන් පමුණුවා ගැනීම සඳහාය.

පළමුව 1999 නොවැම්බර් මස සිට ලබාගත් යුධ ජයග්‍රහණ දේශපාලන ජයග්‍රහණ බවට පත්කර ගැනීමයි. කොටින්ම යුධ බලය විසින් අල්ලාගත් ප්‍රදේශ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්කරගෙන තමන්ගේ භුක්තියට සවිකර ගැනීමටය. ඔවුන් එය ඊනියා සටන්විරාම ගිවිසුමෙන් ලංකා ආණ්ඩුව පාලනය කරන ප්‍රදේශ හා කොටි සංවිධානය පාලනය කරන ප්‍රදේශ නිල වෙන්කර ගැනීමකින් ඉටුකර ගත්හ. මෙලෙස තමන් බලයෙන් යටත්කර ගත් ප්‍රදේශ ද්‍රෝහි ආණ්ඩුව නිසා වසර දෙකක් ඉක්මයන්නට ප්‍රථම තමන්ගේම කරගත්හ. (1967 යුද්ධයේදී ඊශ්‍රායලය අල්ලාගත් ගාසා තීරය, බටහිර ඉවුර හා ගෝලන් ප්‍රදේශ තවමත් තමන්ගේ කරගැනීමට ඊශ්‍රායලයට නොහැකිවී තිබේ. මෙයින්ම කොටි ලබාගත් දේශපාලන ජයග්‍රහණයෙහි තරම පෙනීයයි.)

දෙවනුව ලබාගන්නා දේශපාලන ඉඩකඩ යොදාගනිමින් තම යුධ ශක්තිය හා අධිපත්‍යය ව්‍යාප්ත කර ගැනීමය.

කොටි 2001 දෙසැම්බර් මස ඊනියා සටන් විරාමයට එකගවන විට සිය සෙබළු 17.000 කට අධික ප්‍රමාණයක් මියගොස් පිරිස් හිගයකට ලක්වී සිටියහ. මෙයින් 14.000 ක්ම මරා දැමුනේ රිවිරැස හා ජයසිකුරු මෙහෙයුම් නිසාය. එම මෙහෙයුම්වල යුධ ඉලක්කය අසාර්ථක වුවත් කොටින්ගේ පිරිස් බලයේ කොඳුනාරටිය කඩා දමන්නට එය සමත්විය. විශේෂයෙන් ජයසිකුරු මෙහෙයුම පරාජය කළේ අවශ්‍ය අවස්ථාවේදී එයට අවශ්‍ය අවි ආයුධ සැපයීමට අසමත්වූ පොදු පෙරමුණේ මුදල් අමාත්‍යාංශයත්, එයට අවශ්‍ය පිරිස් බඳවා ගැනීම වැලැක්වූ කොටි ඒජන්තයින් විසින් මෙහෙයවූ පොදු පෙරමුණේ මාධ්‍ය අමාත්‍යාංශය හා තවලම- සුදු නෙළුම ව්‍යාපාරයත්ය. පිරිස් බලයට අමතරව කොටි මුහුණ දුන් ප්‍රශ්නය නම් බැර අවි හිගකමයි. ලංකා හමුදාවේ බහුවිධ රොකට් (MBRL) හා තාප මෝටාර (THEROMOBARIC) වලට ඔවුනට ඔරොත්තු දිය නොහැකිවිය. මෙයට ගුවන් හා නාවික බලයද ඇතුලත් විය.

අනික් අතින් චන්ද්‍රිකා ඝාතන ප්‍රයත්නයට පසුව ක්‍රියාත්මක වූ දිගු විනිවිදන මහසෝන් බලකාය (LRRP) කොටි නායකයින් එකින්එකා විනාශ කිරීමය. (මෙය 1983 දී සිදුකිරීමට තිබූ දෙයකි.)

දැන් රනිලා සටන් විරාම ගිවිසුමෙන් පසු කොටි යුධමය ලෙස මේ සියළු අභියෝග ජයගැනීමට සමත්ව ඇත. බඳවාගන්නා ලද නවක සාමාජිකයින් ගණන 15,000 ඉක්මවා ඇත. මිසයිල (ගුවන් යානා ගෙන ඒමට උත්සාහයක් දැරිණි.) රොකට්, කාලතුවක්කු ඇතුළු බැර අවි අඩුම තරමින් නැව් 11 ක ගෙන ඒමට ඔවුන්ට හැකිවිය. දිගු විනිවිදන කණ්ඩායම් හා ශ්‍රී ලංකා හමුදාවේ ඔත්තුසේවා හා දෙමළ කතා කරන ප්‍රහාරක අංශ සහමුලින්ම විනාශ කිරීමටද ඔවුනට හැකිවිය. අනෙක් අතට සිය දහස් ගණනින් කළු කොටි බලකායන් කොළඹ, මහ නුවර ආදී යුධ -ආර්ථික මධ්‍යස්ථානවල ස්ථානගත කරන්නටද ඔවුන් සමත් විය. මේ අනුව 1968 පෙබරවාරියේ වියට්නාමයේ සිදුවූ "ටෙට්" ප්‍රහාර වලට සමානව රටපුරා එකවර එල්ල කරන දවැන්ත ප්‍රහාරයකට අවශ්‍ය අවි, පිරිස් හා ඔවුනගේ ස්ථානගත කිරීම දැන් කොටි විසින් සාර්ථකව අවසන් කර ඇත. මෙයට සාපේක්ෂව ශ්‍රී ලංකා හමුදා තිබුණු තැන්වලින්ද දුර්වල කරනු ලැබිය. 2002- 03 අයවැය වලින් ප්‍රාග්ධන වියදම්කපා දැමීම නිසා නව අවි හමුදාවලට නොලැබී ගියේය. හමුදා අධෛර්ය කිරීම නිසා 20,000 ක් පසුගිය මාස 12 තුළ හමුදාව හැර ගියේය. එයට දිගු විනිවිදීන සේවාවන්ට අයත්ව සිටි හොඳම සටන්කරුවන්ද ඇතුලත්ය. එමෙන්ම හමුදා කඳවුරු සිය ගණනක් ඉවත්කරගත් අතර අධි ආරක්ෂිත කලාප අහෝසි කිරීම නිසා ප්‍රධාන කඳවුරුද අනතුරට ලක්ව තිබේ. මෙය පියවරින් පියවර ශ්‍රී ලංකා හමුදා උතුරු හා නැගෙනහිරින් ඉවත් කිරීමේ රනිල් වික්‍රමසිංහ - වේලුපිල්ලේ ප්‍රභාකරන් හොර ගිවිසුමේ එකඟතාවය අනුව සිදු කෙරේ. අනෙක් අතින් කොටින්ට මෙතෙක් තමන්ට පයගැසීමටවත් නොහැකිවූ ප්‍රධාන නගර (යාපනය, වවුනියාව, ත්‍රිමලය, මන්නාරම, මඩකලපුව) සියල්ලට ගොඩවී එහි වීසූ සාමාන්‍ය දෙමළ ජනයා තම ග්‍රහණයට ගැනීමට ඉඩ ලැබිණි. එය එතැනින් සාමාන්‍ය මුස්ලිම් හා සිංහල ජනයා ග්‍රහණයට ගැනීම කරා දැන් යොමුවී තිබේ. විශේෂයෙන්ම සාරවත් ඉඩම් අල්ලාගැනීම ඔවුන්ගේ දැන් ඉලක්කයයි.

තුන්වෙනුව කොටි සටන්විරාමයෙන් බලාපොරොත්තුවූනේ ලොවපුරා 9/11 සිදුවීම නිසා ඇතිවූ ත්‍රස්තවිරෝධී මතවාදයෙන් ගැලවී ගැනීමයි. දැන් ඔවුන් එකී ජාත්‍යන්තර රාහු කාලයෙන් ගැලවුනා පමණක් නොවේ. එක පොලිසියක් නොතිබූ (2001) උතුරු හා නැගෙනහිර දෙපලාතේ පොලිසි 23 ක් පිහිටුවූහ. තමන්ගේ අධිකරණ පිහිටුවා ගත්හ. බැංකු පිහිටුවා ගත්හ. ඒ ලෙසින් ඉතා සීඝ්‍රයෙන් වෙනම රාජ්‍යයකට අවශ්‍ය අංග සකස්කර ගත්හ.

දැන් කොටි ඊළඟ ඉලක්කය තමන්ගේ පොලිසි, උසාවි හා පරිපාලනය තව කෙටිකලකට අප ලවා නඩත්තු කරවා ගැනීමයි. ඒ අනුව විදේශාධාර ලංකා ආණ්ඩුවට ලැබෙන අතර කෝටි 8660 ක් තරම් දවැන්ත මුදලක් උතුර හා නැගෙනහිර කොටි සංවර්ධනයට වැය කිරීමට යයි. කොටින්ම දෙමළ ඊළමේ අධිවේගී මාර්ග, වරාය, ගුවන් තොට, ආරක්ෂක කඳවුරු, සුපිරි වෙළෙඳ සංකීර්ණ සියල්ල තැනීමට යන්නේ සිංහල අපිව ණයකාරයන් කර ලබාගන්නා අරමුදල් වලිනි. මේ ද්‍රෝහිකමට ඉඩදිය යුතුද?

ඊලගට අනාථයින් නැවත පදිංචි කිරීමයි. දැනට නැගෙනහිර සංවර්ධන (හකීම්) උතුරු සංවර්ධන (ජයලත්), වන්නි සංවර්ධන (නූර්දීන් මෂූර්) ලෙස ඇමැතිවරු තිදෙනෙක් නැවත පදිංචිවීම් කරති. එයට අමතරව කොටින්ගේ ටී.ආර්.ඕ. (TRO) ව්‍යාපාරයද එයට අතගසා ඇත. අනාථකරනු ලැබූ, ඉඩම් උදුරාගනු ලැබූ, ඓතිහාසික බිම් අහිමිකරනු ලැබූ සිංහලයින් නැවත පදිංචි කිරීමට කිසිවෙක් කිසිම ආයතනයක් ඇතිකර නැත. සිංහල අපේ බදු මුදල් සමග නැවත නැවතත් පිස්සුකෙළීමට රනිල් වික්‍රමසිංහට ඉඩදිය යුතුද?

අනෙක් අතින් දේශපාලන නායකයින්, මහානායකලා ඇතුළු සමාජ නායකයින් සිංහලයන්ට පවා දෙන්දී අධිකරණය වැදගත් තීන්දු දෙකක් දුන්නේය. එකක් නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙක ලබා ගැනීම සඳහා ජී.එල්. පීරිස් හා ඔහුගේ න්‍යායාචාර්යවූ ඇන්ටන් බාලසිංහම් ඉදිරිපත් කල 19 වැනි සංශෝධනය පරාජය වීමයි. එය ජය ලැබුවානම් චන්ද්‍රිකාගේ තවූ කැපීම කෙසේ වෙතත් රට නීල වශයෙන් දෙකඩවීමට පාර්ලිමේන්තුව යොදාගැනීමට ඉඩ තිබිණි. අනෙක් තීන්දුව නම් මිනීමරු ප්‍රභාකරන්ට මහා බැංකු ප්‍රහාරය පිළිබඳව ලබාදුන් වසර 200 ක සිර දඬුවමයි. සියළු නායකයින් ජාතියටත්, යුක්තියටත් ද්‍රෝහිවෙද්දී එකී තීන්දුව ලබා දුන් සරත් අඹේපිටිය විනිසුරුතුමා ඉතිහාසගත වීරයෙකු වී ඇත. එක් විචාරකයකු පෙන්නාදී තිබුණු පරිදි ඔහු සමාන වන්නේ ඉංග්‍රීසි කොඩිය බිමදැමූ (1815) වාරියපොළ සුමංගල හිමියන්ට පමණි ! ඒ ඓතිහාසික අධිකරණ තීන්දුවට පිටුපා අපරාධකරුවනුත් ඔවුනට රැකවරණය දෙන්නවුනත් අත්අඩංගුවට ගෙන යුක්තිය ඉටුකරලීම සඳහා නොපමාව සිංහල සමාජය දැන් ක්‍රියාකළ යුතුය.

මේ කුඩා කෘතිය ලියැවෙන්නේ නැගෙනහිර පළාත උතුරට එක් කිරීම හෝ දෙමළ නාසිවාදී පාලනයකට නතු කිරීමට කිසිම ඓතිහාසික, නෛතික, භූගෝලීය හා ජනගහණමය පදනමක් නැතිබව පෙන්වීමටය. මෙය නැගෙනහිර තම නිජබිමේ කොටසක් ලෙස සලකන දෙමළ ජනවර්ගවාදී මතවාදය පරාජය කිරීම සඳහා ලියවුනෙකි.

මේ සඳහා කරුණු ලබාගැනීමේදී මෙයට පූර්ම මේ ප්‍රශ්නය ගැන සාකච්ඡාකර ඇති ගරු එල්ලාවල මේධානන්ද හිමිපාණන්, හිටපු පුරාවිද්‍යා කොමසාරිස් එච්.එම්. සිරිසෝමයන්, හිටපු ජාතිමාමකයකු වන කේ. සිරිල් මැතිව් මහතාණන්, කේ.එච්.ජේ. විජේදාස මහතාණන්, කේ.ඇම්.ඩී.සිල්වා මහතාණන් ආදීන්ගේ තොරතුරුද ලබාගෙන ඇත. ඔවුන් සියළු දෙනාට ජාතියේ ප්‍රණාමය පිරිනැමේ.

අනෙක් අතින් මතවාද හෝ ඉතිහාසයේ සත්‍ය කරුණු කියාපෑමෙන් පමණක් අද අප මුහුණපාන අනතුර පරාජය කළ නොහැක. රාජ්‍යයන් ගොඩනැගෙන්නේ ඓතිහාසික පදනම් වලින්ම නොවේ. යුධ -දේශපාලන -ආර්ථික බලයද එහිදී තීරණාත්මකය. ඕස්ට්‍රේලියාව අයත් ඓතිහාසික ඇබොරිජිනවරුන්ටයි. එක්සත් ජනපදය අයත් රතු ඉන්දියන්වරුන්ටයි. නමුත් ඔවුන් අද ජාතික අයිතීන් අහිමි ජනයා බවට පත්කර ඇත. පලස්තිනයේත් යම් දුරකට සිදුවඇත්තේ එයයි. මේ නිසා වහාම යුධ -දේශපාලන -ආර්ථික බලය සිංහලයන් අත්පත් කරගත යුතුය. නැත්නම් අප මුහුණපා සිටින ඓතිහාසික අර්බුධය ජයගත හැකි නොවේ.

එවන් නිර්භීත ක්‍රියාවකට දුටුගැමුණු අංකුරවලට ආරාධනයක් ලෙස පමණක් මේ කුඩා කෘතිය ලියන බව අවසාන වශයෙන් සඳහන් කරමි.

# නැගෙනහිර සිංහල උරුමය

## ඉතිහාසය විමසිමක්

1977 මහා මැතිවරණය සඳහා ඉදිරිපත් වූ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ සිය මැතිවරණ ප්‍රකාශනයේ මෙසේ ලියා තිබුණි.

**"......මුළු ලංකාවම ක්‍රි.පූ. 2 වන සියවසේ දී පාලනය කළේ දෙමළ රජෙකු වූ එල්ලාලන් හෙවත් එළාර විසිනි. ඉන් පසු ගෙවුණු වසර දහස් ගණනක ඉතිහාසය තුළ වරක් දෙමළ රජුන් ද තවත් වරක් සිංහල රජුන් ද ලෙස මේ දිවයින පාලනය වී ඇත. ක්‍රි.ව. යෙන් 13 වැනි සියවසේ මුල සිටම ස්වාධීන දෙමළ රාජධානියක් දිවයින තුළ එක දිගට පැවතුණු බව ඉතා පැහැදිලි දේශපාලන කරුණකි. එහි භූමි භාගය හලාවතින් ඇරඹී පුත්තලම හරහා මන්නාරම දක්වාත් එතනින් දිවයිනේ උතුරු කොණ දක්වාත්, එතැනින් නැගෙනහිරට හැරී නැගෙනහිර වෙරළ ඔස්සේ ත්‍රිකුණාමලය හා මඩකලපුව හරහා කුමන දක්වාත් පැතිරී ගොස් තිබුණි.. එය දෙමළ ජනයා සඳහා පමණක් වූ ඔවුන්ගේ ඓතිහාසික නිජ බිමයි. එය ස්වෛරී දෙමළ ඊලාම් රාජ්‍යය සඳහා වෙන්වූ භූමි භාගයයි. මුලින්ම පෘතුගීසින් ද, ඉන්පසු ලන්දේසින් ද ඉනුත් පසු ඉංග්‍රීසින් ද දෙමළ ඊලාම් ප්‍රදේශ අල්ලාගත් අතර ඒවා වෙනම රාජ්‍යයක් ලෙස ඔවුන් විසින් පාලනය කරන ලදී. නමුත් 1833 දී පරිපාලන පහසුව තකා බ්‍රිතාන්‍යයෝ මේ ප්‍රදේශ සිංහලයන් සමග ඒකාබද්ධ කරගත්හ. 1948 දී බ්‍රිතාන්‍යයෝ සිංහලයින්ට නිදහස ලබාදුන් නමුත් දෙමළ ජාතියට හෝ දෙමළ ඊළමට නිදහස නොදුන්හ.."**

**"......ස්වෛරී ස්වාධීන සමාජවාදී දෙමළ ඊළම් රාජ්‍යයක් වත්මන් උතුරු හා නැගෙනහිර දෙපළාතේ දෙමළ ඓතිහාසික නිජ බිමෙහි පිහිටුවා ගැනීම අපගේ එකම හා පරම අභිලාෂය වන්නේය."** (බලන්න - රූපය 1 හා 2 )

උතුරු හා නැගෙනහිර දෙපළාත විශේෂයෙන්ද මුළු රටම සාමාන්‍යයෙන්ද අතීතයේ දෙමළ රටක්ව තිබූ බව සනාථ කිරීම සඳහා නිබන්ධනයක් ලියූ මුදලි සී. රාසනායගම් ගේ "අතීත යාපන ඉතිහාසය" නම් කෘතියට පෙර වදනක් ලියන මදුරාසි විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ක්‍රිෂ්ණස්වාමි අයියනගාර් මෙසේ පවසයි.

**"කතුවරයා විසින් (ලංකා දිවයින) දෙමළ වදනක් වූ ඊලාම් යන්නේ හැනුණු බවට පළ කර ඇති අදහස් අපට පිළිගත නොහැක. ඊලාම් යන්න අපට නම් පෙනී යන්නේ සෘජුවම පාළි "සිහලං" යන්නෙන් (සිහල රට) බිඳී ආවක් ලෙසයි. දෙමළෙන් එය සින්ගලම් හෝ සින්ගනම් කියා හෝ ලිවිය හැක. නමුත් දඩි දෙමළ කරණයකදී එය ඊළම් බවටම පත් වේ. මෙය කෝසලයේ ජාජ්නගර් දෙමළෙන් සාඩිනගර් වී පසුව ආඩිනගර් වූ ලෙසයි. "ස්" ශබ්දය "ඊ" ශබ්දය බවටත් "හා" ශබ්දය "ලා" ශබ්දය බවටත් පත්වීම දෙමළ බසට එතරම් මවිතයක් නොවේ"**

මෙයින් පෙනී යන්නේ "ඊලාම්" යන වදන පවා සිහලේ නම් ලංකාව හැඳින්වීමට යොදා ගත් වදනින් දෙමළ කරණය වී හැනුණු වදනක් බව දෙමළ විද්වතුන් පවා පිළිගන්නා බවයි.

ඊළගට අප විමසිය යුත්තේ වත්මන් උතුරු හා නැගෙනහිර දෙපළාතේ මායිම් තීරණය කළේ කවුද? එය කුමන පදනමකින් සිදුවූවාද යන්නය. එයට පෙර සිංහලේ පළාත් තුනකට බෙදී තිබිණි. (රූපය අංක 3)

ලොරෙන්සෝද අල්මේද ලංකාවට ගොඩබසින්නේ 1505 නොවැම්බර් 15 වනදය. පෘතුගීසින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නැව් තොට පාලනය කළා මිස රට තුළට කාඩාවැදුනේ නැත. එසේ කාඩාවැදීමට දරන උත්සාහයන් සිංහලයන් විසින් ව්‍යර්ථ කරන ලදී. ලන්දේසින් විසින් පෘතුගීසි ප්‍රදේශ ක්‍රිව. 1656 දී අල්ලාගන්නා ලදී. සිංහලේ රජ සමග 1766 දී ඇති කරගත් ගිවිසුමකින් නැගෙනහිරවෙරළේ සිට ගව්වක සීමාවක් පාලනය කරන ලදී.(බලන්න රූපය 4 ) ඉංග්‍රීසින් විසින් ලන්දේසි ප්‍රදේශ ක්‍රිව. 1796 දී අල්ලාගන්නා ලදී. බදු එකතු කිරීම සඳහා මුහුදු බඩ ප්‍රදේශවල බදු ප්‍රාන්ත තුනක් හා පරිපාලන ඒකක 13 ක් ඇති කරන ලදී. 1815 දී සිංහලේ ප්‍රධානීන් විසින් තම බල ප්‍රදේශ පාලනය ගිවිසුමක් මගින් ඉංග්‍රීසින්ට පැවරීමෙන් පසු ඔවුනට වත්මන් නැගෙනහිර ප්‍රදේශවල පාලනය හිමිවිය.

කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ (1833) මගින් සිංහලේ පැවැති චිරස්ථායි සංවර්ධන රටාව බිඳ දමා වාණිජ ආර්ථික ක්‍රමයක් සහිත සමාජයක් බලයෙන් අපමන පටවන ලදී. එහිදී රට පළාත් 5 කට බෙදා වෙන් කරන ලදී. ඒවා නම් උතුර, නැගෙනහිර, බටහිර, මධ්‍යම හා දකුණ වේ. මෙයට අමතරව මේ පළාත් පරිපාලන දිස්ත්‍රික්ක වලටද බෙදා වෙන් කරන ලදී. මෙහිදී පදනමක් ලෙස කිසිදු භාෂා, ආගමික හෝ ඓතිහාසික වාස භූමි පිළිබඳව හෝ සැකීමක් ඉංග්‍රීසින් විසින් නොකල බව එකී පළාත් සීමා දෙස බැලීමෙන් පෙනීයයි. නමුත්එකී බෙදීමට වෙනත් අරුතක් තිබුණි. (බලන්න රූපය 05)

ඉන් පළමුවැන්න නම් කන්ද උඩරට හා ඈත ඌව - රුහුණ දක්වා පැතිර ගිය (1817 - 18) සිංහල විමුක්ති කැරැල්ල මර්ධනය කිරීමෙන් පසු සිංහල රාජධානිය කැබැලි කිරීමේ උවමනාවයි. ඒ අනුව නුවර කලාවිය හා වන්නි ප්‍රදේශ උතුරු පළාතටද, පොලොන්නරුව හා ඓතිහාසික මහියංගනය - බින්තැන්න ප්‍රදේශ නැගෙනහිරටද, සබරගමුව, බටහිරටද යා කරන ලදී. ඊළග අරමුණ වූයේ සිංහලේ පැවතුණු රාජධානිය වූ කඳුරටද, අතීත රාජධානිය පිහිටි නුවර කලාවියද දෙමළ ජනපදකරණයට යටත්කර සිංහලයන් ජනගහනමය ලෙස දුර්වල කිරීමේ උපායක නිරත වීමයි. තුන්වෙනි අරමුණ වූයේ අයබදු අය කිරීම ආරක්ෂාව හා පරිපාලනය විධිමත් කර ගැනීමය. එයට කිසිම භාෂාමය, ආගමිකය හෝ ජන වාර්ගික පදනමක් තිබුනේ නැත. එහි මූලික අරමුණ වූයේම සිංහල ජාතික හැඟීම් බෙද වෙන්කර පාගා දැමීමයි.

පසුව වයඹ පළාත (1845), උතුරු මැද පළාත (1873), ඌව (1886) හා සබරගමුව (1889) බිහිවිය. ඉංග්‍රීසි පාලනයෙන් මිදී දශක පහකටත් වැඩි කාලයක් ගතවී ඇතත් කිසිම දේශීය පාලකයෙක් මේ පළාත් මායිම් වෙන්කර රටේ ඉතිහාසයට, භූගෝලීය පිහිටීමට හා සංස්කෘතියට එකග නව පළාත් මායිම් ඇති කරන්නට කටයුතු නොකිරීමෙන් පෙනීයන්නේ ඔවුන්ගේ වහල් මානසිකත්වයයි.

දැන් අපි උතුරු පළාත මදකට අමතක කර නැගෙනහිර පළාතේ සිංහල ඉතිහාසය මදක් විමසා බලමු.

නැගෙනහිර පලාත පැරණි සිංහල රාජධානියේ කොටසක් බවට ප්‍රකාශ කළ හැකි මූලික පුරා විද්‍යා සාක්ෂිය සෙල්ලිපියයි. නැගෙනහිර පලාතෙන් හමුවූ පැරණි සෙල්ලිපි වලින් කීපයක් මෙසේය.

වත්මන් කුච්චවේලි ප්‍රදේශයේ කඩ්ඩුකුලම (කවුඩු වැව) ගම්මානයෙන් හමුවූ සෙල්ලිපිය ක්‍රි.ව. 6 වැනි සියවසට අයත් අතර හමුවූ බුදුරුව 2 වැනි සියවසට අයත්වේ. කල්ලම් පත්තුවේ ඇති සෙල්ලිපිය ක්‍රි.ව. 10 වැනි සියවසට අයත්ය. මෙය පස්වැනි කස්සප යුගයට අයත් අතර එය උතුරු පලාතේ තුනුකායි සෙල්ලිපියට සමකාලීන වේ. එයින් පෙනියන්නේ උතුරට හා නැගෙනහිරට අයත් මේ ප්‍රදේශ10 වැනි සියවසේදී පවා එකම සිංහල පාලන තන්ත්‍රයකට යටත්ව තිබූ බවය. කාවන්තිස්ස රජු යුගයේදී සේරුවිල ගොඩනැගීමේ විස්තරයක් ධාතුවංශයේ එයි. කල්කුලමේ උඩිගල දගැබ එහි සෙල්ලිපියකින් දුටුගැමුණු යුගයේ ආරම්භ වූවක් බව පෙන්නා දෙයි. වැලි කන්ද - වාලච්චේන ප්‍රදේශයේ ඇති නෙළුගල ඇති ගිරිලිපියකින් පෙන්නා දෙන්නේ එහි ඇති පියංගල විහාරය දෙවැනි භාතිය තිස්ස රජුගේ යුගයට අයත් වූවක් බවයි. ඒ ප්‍රදේශයේ පාලකයා වූයේ "අගල" නම් සිංහල ඇමතිවරයෙකු බවද සෙල්ලිපිය තව දුරටත් කියයි.

මඩකලපු දිස්ත්‍රික්කයෙන් හමුවූ වසභ රජුගේ යුගයට අයත් (කාසිමොට්ටේ) සෙල්ලිපියකින් කියවෙන්නේ වත්මන් නැගෙනහිර ප්‍රදේශ අයත්වූ රෝහණ ප්‍රදේශය පවා පරිපාලනමය පහසුව තකා කොටස්වලට වෙන්ව තිබූ බවයි. පජ්නිකර නමින් හැඳින්වූ නැගෙනහිර වෙරළ ප්‍රදේශය (වත්මන් මඩකලපු දිස්ත්‍රික්කය) දේවනක නම් ඇමැතියකු පාලනය කළ බව සඳහන් කර ඇත. යාපනයේ වල්ලිපුරම් රන්පතට සමකාලීන මේ ලිපියෙන්ද පෙන්නා දෙන්නේ සිංහල රජුනට යාපනයේ (ඉසගිරි ඇමැති) සිට (දේවනක) ඇමැති දක්වා ඒකීය පාලනයක් උතුරේ සිට නැගෙනහිරට තිබූ බවය.

දඹිලියද්දේ ගම, කුසලාන් කන්ද, ඕමුණු ගල, කෝපාවලි හා රුගම ආදී ස්ථානවල සෙල්ලිපි වලින්ද පෙන්නා දෙන්නේ නැගෙනහිර සිංහල ඉතිහාසයයි. අක්කරපත්තුව අසල ඇති මොට්ටමුලේ කන්දේ ඇති පර්වත ලිපියේද මාගම පරපුර වෙරළ දක්වා සිය බලය පවත්වාගෙන ගිය ආකාරය පෙන්වා දෙයි. දීගාමඩුල්ලේ කොණ්ඩවටුන සෙල්ලිපිය පෙන්වා දෙන්නේ වත්මන් අම්පාර ප්‍රදේශය පස්වන දප්පුල (ක්‍රි.ව. 934) යුගයේ පවා සිංහල බවය. ඒ රජතුමා යාපනයේ කන්දරෝඩේහිද ,(කඳුරගොඩ) සෙල්ලිපියක් තබා ඇත. රාස්සම් සෙල්ලිපිවල ගල්ඔය (ගල්තොය) හා දීගාමඩුල්ල පිරිසිදු සිංහල බසින් සඳහන්වී ඇත. පොතුවිල් මුහුදු මහා විහාරය අසල රොටකුලමේ සෙල්ලිපිය මගින්ද සනාථ වන්නේ ප්‍රදේශයේ සිංහල උරුමයයි. ලාහුගල මගුල් මහා විහාරයේ ඇති සෙල්ලිපියකට අනුව ගම්පල යුගයේදී පවා එකී ප්‍රදේශ සිංහල රජුට අයත් බව පෙනී යයි. තවත් ලිපියකින් දක්වෙන්නේ තබා වෙහෙර හෙවත් දීඝවාපිය වන්දනා කිරීමට මහනුවර යුගයේදී කීරති ශ්‍රී රාජසිංහ රජු පැමිණි බවය. ලාහුගල ප්‍රසිද්ධ සෙල්ලිපිය ක්‍රි.ව. 2 වන සියවසට අයත්ය. තිරුකටිස්වරමේ ටැම් ලිපිය දෙවන සේන යුගයට (ක්‍රි.ව. 835) අයත් වූවකි. (බලන්න රූපය 06)

මෙහිදී අප සඳහන් කළේ සිය දහස් ගණනක් සෙල්ලිපි වලින් කිහිපයක් පමණි. එහි විශේෂත්වය වනුයේ කිසිම සෙල්ලිපියක දෙමළ බසින් දෙමළකම සඳහන් නොවීමයි. උතුරු පලාතේ පවා ඇත්තේ මහා පරාක්‍රම බාහු විසින් පිහිටුවන ලද නයිනතිව් සෙල්ලිපිය (දෙමළ) පමණි.

නැගෙනහිර පලාතේ සිංහල - බෞද්ධ සිද්ධස්ථාන පෙළ කියාපාන්නේද එකී ප්‍රදේශ නිසැකවම සිංහලයන්ට අයත්ව තිබූ බවයි. හිටපු පුරා විද්‍යා කොමසාරිස් එම්.එච්. සිරිසෝමයන්ට අනුව පැරණි බෞද්ධ සිද්ධස්ථානවල නටඹුන් වත්මන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ස්ථාන 86 කින්ද, මඩකලපු දිස්ත්‍රික්කයේ ස්ථාන 27කින්ද, අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාන 23 කින්ද හමුවී ඇත. එල්ලාවල මේධානන්ද හිමියන්ට අනුව ඒවා පිළිවෙලින් ත්‍රිකුණාමලයේ 112 ක්ද, මඩකලපුවේ 57ක්ද අම්පාරේ 86 ක්ද වේ. ගවේෂණය නොකළ හා දෙමළ ජාතිවාදීන් විනාශ කළ තවත් අති විශාල ප්‍රමාණයක් සිංහල - බෞද්ධ සිද්ධස්ථාන එහි පවතිනවා ඇත. (රූපය - 7)

දනටත් පුද පූජා වලට ලක්වන ස්ථාන නම් ත්‍රිකුණාමලයට අයත් තිරියාය සිද්ධස්ථානයයි. එය බුදුරජුන්ගේ කේශ ධාතුන් තැන්පත් කර ඇතැයි විශ්වාස කරන ගිරිගඩු සෑය යැයි විශ්වාස කෙරේ. පෘතුගීසීන් හා පැමිණි කතෝලික පියනමක් වූ ක්වෙරෝස්ට අනුව වත්මන් ත්‍රිකුණාමලයේ ෆ්‍රෙඩ්රික් කොටුවේ ඇති නටඹුන් විහාරය වූ කලී මහසෙන් රජු කරවූ ගෝකන්න විහාරයයි. එය කොන්ස්ටන්ටයින් ද සා විසින් ජේසුයිට් පූජකයන්ගේ ඉල්ලීම මත විනාශ කරන ලදී. එහි නටඹුන් කැනීම් වලින් හමුවූ අතර දැන් එහි හින්දු කෝවිලක් කොනේෂ්වරන් නමින් ඉදිකර ඇත.

සේරුවිල හා රට සමීප මුහුද අසල ඇති ලංකා පටුනද ඉතා වැදගත් සිද්ධස්ථානයක් වෙයි. දළදාව රැගෙන පිරිස ගොඩබටුයේ ලංකා පටුනට වන අතර එහි දකුම්කළ මුහුදු විහාරයක් අතීතයේ පැවති ඇත.

දීඝවාපිය වනාහි බුදුන් වැඩි බිමක් ලෙස සැලකේ . වෙහෙර මහා දේවිය අවසන් කළ පැවිදිව සිටියේ එහි බවද කියවේ.

නැගෙනහිර පලාතේ සිංහල - බෞද්ධ නටඹුන් හා අද දක්වා පවතින සිද්ධස්ථාන පෙන්වා දෙන්නේ අතීතයේ එහි තිබූ සිංහල උරුමයයි. දනට පවතින අන්‍යාගමික සිද්ධස්ථාන බොහොමයක් මෑත කාලයේ ගොඩනැගූ ඒවාය.

නැගෙනහිර සිංහල ඉතිහාසයට රිළඟ සාක්ෂිය ප්‍රදේශයේ පුරා පැතිර ඇති වාරි පද්ධතියයි. එමර්සන් ටෙනන්ට් සිය "සිලෝන්" කෘතියේ (1860 - 360 පිටුව) මෙසේ කියයි. " **සිංහලයන්ට ( වාරි කර්මාන්තයේ) ලැබුනු දනුම කාගෙන් ලැබුණත් ඔවුහු අන්කිසි රටකටත් වඩා ඉහලින් එහි නියැලී සිටියහ. ඉතුරුව ඇති වැව් වල නටඹුන් කියාපාන්නේ පැරණි ප්‍රෞඩත්වයයි. එවැනි නිර්මාණයන් සමකාලීන කිසිම ජාතියක් විසින් නිර්මාණය කර නැත.**" චීනය හා එහි ශිෂ්ටාචාරය පිළිබඳ දවැන්ත කෘතියක් කළ ජෝශප් නීඩ්හැම් පවා කියන්නේ චීනයට පවා වාරි තාක්ෂණය ලැබුනේ සිංහලයන්ගෙන් බවයි.

ලෝකයේ විවිධ රටවල (දකුණු ඉන්දියාවේත්) ජලය පොකුණු වලට එක් රැස් කිරීම පැවතුනද,කුළු වැව් වලින් මහාවැව් තැනීමත්, මහා වැව් අනුයාත පිළිවෙලට සැකසීමත්, ගංගා හැරවීම හා සූක්ෂම ඇළ වේලි නිර්මාණයන් සිංහලයන්ට පමණක් ආවේණික වූවකි. කිසිම දෙමළ රජෙකු හෝ ශිෂ්ටාචාරයක් එවැන්නක් කර නැත. මේ නිසා නැගෙනහිර ඇති මහා වැව් පද්ධතිය (මොරවැව, ගන්තලාව-කන්තලේ වැව, සේරුවාවිල, ඇල්ල වැව, රූකම, ජයන්ති වැව, පිඹුරත්තාව වැව, ඉරක්කාමම් හා සාකමම්) ආදී පෙන්වා දෙන්නේ එකී ප්‍රදේශ සිංහල වාරි කර්මාන්තයේ පදනමක් බවයි.

ඊළඟ වැදගත්ම සාධකය වූ කලී ගම්වල නාමයන්ය. නැගෙනහිර පළාතේ බොහෝ නගර හා ගම් එක්කෝ සිංහල නම දෙමළකරණය විමය. නැත්නම් සිංහල නම දෙමළට පරිවර්ථනය විමය. ඒත් නැත්නම් මෑත කාලීන ලෙස නම් දෙමළෙන් තැබීමය.

සිංහල නම් ගම් දෙමළකරණය වීමට උදහරණ නම් ගන්තලාව යන්න කන්තලෙයි වීමයි. (දෙමළෙන් 'ග' යන්න 'ක' ලෙස හඬ නගයි. රුගම යන්න රුකාමම් ලෙසද, සාගම යන්න සාකමම් ලෙසත් හඬ නගා ඇත.) එසේත් නැත්නම් සිංහල නාමය දෙමළට පරිවර්ථනය කර ඇත. ත්‍රිකුණාමලයේ අතීත නාමය ගෝකන්නය. එය හෙළයෙන් ගෝණ වේ. දෙමළෙන් කෝණ වේ . තිරු - කෝණ - මලෙයි යනු ගෝණ ගේ ශුද්ධ කන්ද යන අරුත දෙනබව එච්.එම්. සිරිසෝමයන්ගේ මතයයි. මේ ලෙසම කලින් පුලියන් දුව ලෙස හැඳින්වූ මඩකලපුව මට්ටෙයි (මඩ) කල්ලපු (කලපුව) වී ඇත. තව දුරටත් කියන්නේ නම් තිරියාය, තිරියායි ලෙසද, වලස්තේන-වාලච්චේන ලෙසද, පොතුවිල පොතුවිල් ලෙසද, නිල්වැල්ල- නිලාවේලි ලෙසද, තඹලගම- තඹලකාමම් ලෙසද දෙමළකරණය වී ඇත. මෙයට අමතරව මෑත කාලීනව ඇතැම් ප්‍රදේශ වලට නව දෙමළ නාමයන්ද තබා ඇත.

ඊළඟ සාධකය වූ කලී වංශකතාවන්ය. අන්කිසි ජාතියකට හෝ ජනවර්ගයකට නැති ලෙස සිංහලයන් සිය ඉතිහාසය ලිඛිතව ලියා ඇත. දීප වංශය, චූල වංශය, මහා වංශය, ධාතු වංශය,මන්දරම් පුවත ආදී අපේ පැරණි ලේඛන වල නැගෙනහිර සිංහල උරුමය මැනවින් සඳහන් වී ඇත. කිසිම වංශකතාවක් හෝ ඉතිහාස වර්ණනයක් නැගෙනහිර ගැන දෙමළෙන් අතීතයේ ලියවී නැත. (ඇත්තේ ලන්දේසි යුගයේ යාපනය ගැන ලියන ලද යාල්පානම් වයිපාලමේ පමණි. එහිදී නැගෙනහිර ගැන සඳහනක් නැත. මඩකලපුව ගැන දෙමළ ජනවර්ගවාදීන් ඉතාම මෑත මට්ටකලප්පු තමිලකම් නමින් නව ප්‍රබන්ධ කෘතියක් කර ඇත.)

තුහන ලියවිලි විශේෂයෙන් විදේශිකයන්ගේ ලියවිලි පෙන්නා දෙන්නේද නැගෙනහිර සහමුලින්ම සිංහල රජුට අයත්ව තිබූ බවයි.

පැරණි විදේශිකයන්ගේ සිතියම් (ක්ලෝඩියස් තොලමි - ක්‍රිව. දෙවන සියවස) වර්තෝමා, මුන්ස්ටර් හෝ එද්රිසි - (ක්‍රිව. 11 - 12සියවස) නැගෙනහිර දෙමළ නාමයන් පිළිබඳ කිසිවක් සඳහන් නොකරයි. අඩු තරමින් ඔවුන් යාපනය පිළිබඳවත් සඳහන් නොකිරීමෙන් පෙනියන්නේ 14 වැනි සියවස දක්වා එහි කිසි දේශපාලන වැදගත්කමක් නොවූ බවයි. ස්පාඤ්ඤ සිතියම් කරුවකු වූ සිපිරියානෝ සැන්චාක් (ක්‍රිව. 1560) පෙන්නා දෙන්නේකෝට්ටේ සිංහල රජු යටතේ ප්‍රධාන පළාත් 9 වූ ක් බවයි. ඒවා නම් කෝට්ටේ, සීතාවක, නුවර, සත් කෝරළය, හලාවත, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව හා යාලයි. මෙයින්ද පෙනී යන්නේ පෘතුගීසින් පැමිණෙන විට පවා නැගෙනහිර ප්‍රදේශ සිංහල රජුට (කෝට්ටේ හෝ පසුව කන්ද උඩරට) අයත්ව තිබූ බවයි.

ක්‍රිව. 1602 දී ලන්දේසි අද්මිරාල් වරයෙකු වූ ජෝරිස් වැන් ස්පිල්බර්ජන් මඩකලපුවට ගොඩබට විට විමලධර්මසූරිය රජුගේ සිංහල ආරක්ෂකයන් හා ඔහු රජු දකිමට මහියංගනය හරහා මැදමහනුවර සිට මහනුවරට ගිය බව වාර්තා වී ඇත. ක්‍රිව. 1660 දී ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් ත්‍රිකුණාමලයට ගොඩබට විට තඹලගමුවේ දිසාව විසින් ඔහුව සිංහල රජු හමුවට පමුණුවා ඇත. මෙයින් පෙනී යන්නේ 17 වැනි සියවසේද නැගෙනහිර වෙරළ පාලනය කලේ සිංහල රජුන් බවයි. 16 වැනි සියවසේ විසූ පෘතුගීසි ඉතිහාසඥයකු වූ දී ක්වෙරෝස්ට අනුව කෝට්ටේ සිංහල රජුට මහ රජු ලෙස සෙසු පළාත් 5 ක ප්‍රාදේශිය පාලකයින් යටත්ව සිටි බව කියවේ. ***(Temporal and Spiritual Conquest of Ceylon - Book I- Pg. 101)*** එවැනි එක් ප්‍රදේශයක් වූයේ යාපනයයි. නමුත් වන්මින් නැගෙනහිර පළාතේ එක අඟලක් හෝ එයට අයත්ව නොතිබිණි.

ලන්දේසි මිෂනාරිවරයෙකු වූ පිලිප්ස් බෝල්දියස්ට අනුව (1660) මහනුවර රජු (රාජසිංහ) කෝට්ටේ, සීතාවක, දඹදෙණිය, අනුරපුර, මාතලේ, මාතර, ඌව පමණක් නොව බින්තැන්න, මඩකලපුව හා ත්‍රිකුණාමලය හා යාපනයද පාලනය කර ඇත. 1663 දී ලන්දේසි ආණ්ඩුකාර වැන් ගෝන්ස් සිය රටට යවන ලිපියක සඳහන් වෙන්නේ වලවේ ගඟේ සිට ත්‍රිකුණාමලය දක්වා මුහුදු තීරයේ තමන්ට බලය පවත්වා ගන්නට අපහසු වී ඇත්තේ කන්දේ සිංහල රජුගේ බලය නිසා බවයි.

මේ සියළු විදේශිකයන්ගේ වාර්තාවලින් පෙනී යන්නේ 1766 දී ලන්දේසි ආණ්ඩුකාර ප්ලැක් (**Flack**) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමග ගිවිසුමකින් බැඳී නැගෙනහිර වෙරළ (මුහුදේ සිට සැතපුම් 4 ක්) අත්පත් කර ගන්නා තෙක් වන්මින් මුළු නැගෙනහිර පළාතම අයත් වූයේ සිංහල රජුට බවයි. එහි කිසිම දෙමළ සලකුණක් නොවූ බව පැහැදිලිය.

මේ සඳහා වන තවත් සාක්කියක් නම් නැගෙනහිර පළාතේ පදවියේ සිට පානම දක්වා කිසිදු ප්‍රදේශයක යාපනයට අයත්වූ මලබාර් ඉඩම් නීතිය එනම් තේසවලමේ නීතිය ක්‍රියාත්මක නොවූ බවයි. තවද ඒ ප්‍රදේශ වල විවාහ නීතිය වන්නේ උඩරට විවාහ නීතියයි. තව දුරටත් ශ්‍රී දළද මැදුර සඳහා දියවඩන නිලමේ තෝරාපත්කිරීමේදී පදවියේ සිට පානම දක්වා සිංහල ප්‍රාදේශවල උප දිසාපතිවරුන්ට ඡන්ද අයිතිය තිබිණි. එමගින්ද පෙනී යන්නේ ඉංග්‍රීසින් (1815 ගිවිසුම) එකී ප්‍රදේශ සිංහල රාජධානියේ අඛණ්ඩ ප්‍රදේශ ලෙස පිළිගෙන සිටි බවය.1766 ලන්දේසි -සිංහල ගිවිසුමත්, 1815 ඉංග්‍රීසි -සිංහල ගිවිසුමත් පෙන්වා දෙන්නේ නැගෙනහිර (හෝ උතුර) සිංහලයින් හැරුණු විට වෙනත් කිසිම දේශපාලන අධිපත්‍යයකට යටත්ව නොතිබුණු බවයි. එයම නැගෙනහිර (මෙන්ම උතුරෙත්) උරුමය සිංහලයාටම බව ඔප්පුකරන ජාත්‍යන්තර වශයෙන් වැදගත් නීතිමය සාක්කියකි.

මේ සඳහා තව දුරටත් සාධක ලෙස දෙමළ බසද ගෙනහැර දැක්විය හැකිය. ද්‍රවිඩ භාෂා කුලකයෙන් වසර සිය ගණනකට පෙර වෙන්වූ දෙමළ හා මලයාලම්, කන්නඩි ,තෙලිගු ආදී භාෂා අතර අද ඇතිවී තිබෙන වෙනස්කම් හා මද්‍රාසි දෙමළ, යාපන දෙමළ මඩකලපු දෙමළ අතර වෙනස්කම් සැලකූවිට පෙනීයන්නේ කුමක්ද? යාපන දෙමළ මෙන්ම නැගෙනහිර දෙමළ බසද වැඩීම වූවහොත් සියවස් තුනක පමණ කාලයක සිට මද්‍රාසි දෙමළෙන් වෙනස් වන බවයි. එයින්ද පෙනී යන්නේ නැගෙනහිර පමණක් නොව යාපනයේද දෙමළ ජනයාගේ ඉතිහාසය මෑත කාලීන වන බවයි.

එපමණක් නොව නැගෙනහිර දෙමළ ජනයා සිය "ඓතිහාසික නිජබිම" වෙනුවෙන් කිසිම සටනක් කිසිද කිසිම ආක්‍රමණිකයෙකුට එරෙහිව සිදුකර නැත. සංකිලි විසින් මන්නාරමේ දී කළ හින්දුව සිට කතෝලික වූ ජනයා සමූල ඝාතනය නිසා ඇතිවූ ගැටුම මිස කිසිදු සටනක් උතුරු පළාතේ සිදුවී නැත.

මෙයින්ද පෙනී යන්නේ සිංහලයන් සිය නිජ බිම වෙනුවෙන් 1505 සිට සටන් කළ මුත් දෙමළ ජනයා ඒ ප්‍රදේශ වලට ආගන්තුකවූ නිසා ආක්‍රමණිකයන් හා සටන් නොකළ බවයි.

මේ සියලු සාධකවලින් නිසැකව පෙනී යන්නේ අනාදිමත් කාලයක සිට ක්‍රි.ව. 1766 වන තෙක් වත්මන් නැගෙනහිර පළාත මුළුමනින්ම සිංහල ජනාවාසයක් බවය. සිංහලේ අඛණ්ඩ කොටසක් බවය. සිංහල රජුන්ගේ පාලනයට යටත්ව තිබූ බවය. 1766 දී වෙරළ තීරය සිංහලයන්ට අහිමි විය. නමුත් 1815වනතෙක්ම පදවිය, මොරවැව, තඹලගමුව, ගන්තලාව, සේරුවිල, වැව්ගම් පත්තුව, බින්තැන්න පත්තුව ඇතුළු ප්‍රදේශ සිංහලයන්ට අයත්ව තිබුණි. එය අද දක්වා එසේමය.

## දෙමළ ව්‍යාප්තවාදය හා නැගෙනහිර

හයවැනි සියවසේ සිට නමවන සියවස දක්වා වූ කාලයේ දී දෙමළ බස දකුණු ඉන්දියාවේ ප්‍රබෝධයෙන් වැඩී ගියේය. ද්‍රවිඩ භාෂා කුලකයේ සෙසු භාෂාවලින් වෙන්ව් වෙනම සාහිත්‍යයික අනන්‍යතාවයක් ලෙස එය සංගම් යුගයේදී ගොඩනැගිණි. එය චෝල රාජවංශවල භාෂාව බවට පත්විය.

එකලොස්වැනි සියවසේ දී (1017 - 70) රාජ රාජ හා රාජේන්ද්‍රචෝල ගේ කොට්යා සලකුණ සහිත වූ ආක්‍රමණයෙන්  හෝ ලංකාවේ කිසිම ප්‍රදේශයක ස්ථිර දෙමළ ජනාවාස ඇතිවූ බවට පුරා විද්‍යාත්මක හෝ වෙනත් සාක්ෂි නොමැත. නමුත් විවිධ යුගවල දී පැමිණි ආක්‍රමණිකයන් ගේ දෙමළ ඉතුරු බිතුරුද, දෙමළ වෙළෙන්දන් ද, කුලී හේවායන්ද ආදී ලෙස දෙමළ ජන කණ්ඩායම් ලංකාවේ සිටියහ. සුප්‍රකට දෙමළ ඉතිහාසවේදියකු වූ මහාචාර්ය කාර්තිගේසු ඉන්ද්‍රපාලන් පවා ප්‍රකාශ කරන්නේ මෙසේය.

**"දෙමළ ආක්‍රමණ (ලංකාවට) සිදුවූ ආකාරය දෙස බලන විට ආක්‍රමණිකයන් හා කුලී හේවායින් ලෙස පැමිණි පිරිස, වෙළදාම පිණිස පැමිණි පිරිසට වඩා බොහෝ වැඩි බව පෙනේ." වංශකතා මූලාශ්‍ර අනුව දෙමළ ජනාවාස ක්‍රිස්තියානි යුගයට පෙර හෝ පසු සියවස්වල ලංකාවේ පැවැතුන බවක් නොපෙනේ. " සියළු සාධක එකට ගෙන බලන විටත් 10 වැනි සියවස දක්වා පැතිර ගිය (ස්ථිර) දෙමළ ජනාවාස නොවිය." කෙසේ වෙතත් (යාපනයට) බහුතර ස්ථිර පදිංචිකරුවන් 13 වැනි සියවස අග භාගය14 වැනි සියවස මුල පැමිණි බව පෙනියයි."** ***(Early Tamil Settlements in Ceylon - Royal Asiatic Society Journal 1969 -vol xIII - Pg 47,53,54,60)*** ඉන්ද්‍රපාලයන් ගේ මතය අනුව පවා පෙනීයන්නේ 14 වැනි සියවසේ දී යාපන අර්ධද්වීපයේ හැර වන්නියේ හෝ නැගෙනහිර කිසිම ප්‍රදේශයක ස්ථිර දෙමළ ජනාවාස නොවූ බවයි.

යාපනයේ දෙමළ ජනාවාස මුල් යුගයේ කිහිප ආකාරයකින් ඇතිවන්නට ඇත. කාලිංග මාඝ විසින් රජරට ශිෂ්ඨාචාරයට 13 වැනි සියවසේ කළ විනාශයත්, පාරිසරික හා ආර්ථික සාමාජ්‍ය හේතු නිසාත් රජරට නාගරික ශිෂ්ඨාචාරය බිඳ වැටුණි. දෙවැනි පරාක්‍රමබාහු විසින් කලාවැව අසලදී තීරණාත්මක ලෙස මාඝව යුදමය ලෙස පරාජය කළද පොලොන්නරු ශිෂ්ඨාචාරය පැරණි තත්වයට යළි පත්කළ නොහැකිවිය. මේ නිසා බොහෝ පිරිස් පොලොන්නරුව අතහැර ගිය අතර එසේ යන ආක්‍රමණිකයන්, කුලී හේවායන් හා වෙළෙන්දන් ගේ එක නවාතැන්පලක් වූයේ යාපනය අර්ධද්වීපයයි.

යාපනයේ මෙලෙස ඇති වූ ජනාවාස ප්‍රාදේශීය පාලන ක්‍රමයක් කරා පරිවර්ථනය විමට දකුණු ඉන්දියානු යුධ - දේශපාලනික අවශ්‍යතා බලපෑවේය. විශේෂයෙන්ම සියවස් ගණනක සිට 14 වැනි සියවස දක්වාම එකිනෙකා අභිබවා යෑමට චෝලයන් හා පාණ්ඩ්‍යයින් කළ අනවරත අරගලයද එයට හේතු විය. මේ අන්‍යෝන්‍ය අරගලයේ දී ඇතැම්විට ජයග්‍රහකයා තීරණය කළේ සිංහල රජුගේ සහායෙන් වීම නිසා චෝල - පාණ්ඩ්‍ය රාජවංශ දෙකම සිංහල රාජ්‍යයේ බලපෑම අවම කර ගැනීම සඳහා යුධ උපාමං සෙවූහ. එහි එක් පියවරක් වූයේ දකුණු ඉන්දියාවේ ඉදිරි ආරක්ෂක වළල්ලක් ලෙස යාපනයේ ජනාවාස යොදා ගැනීමයි. සිරිවිජය රජකුමරුවෙක් වූ ජාවක චන්ද්‍ර භානුගේ ලංකා (යාපහුව) ආක්‍රමණය හා දෙවන විජයබාහු  විසින් ඔහු පසුබැස්සවීමෙන් පසු හෙතෙමද (චන්ද්‍රභානු) පසුබසින්නේ යාපනයටය. මේ අතර පාණ්ඩ්‍යයන් දෙමළ චෝලයන් අභිබවන නමුදු අලුත් අභියෝගයකට මුහුණදෙයි. ඒ නම් මුස්ලිම් ආක්‍රමණයයි. මලික් කපූර් විසින් පාණ්ඩ්‍ය රාජ්‍යයට පහර දීම නිසා පාණ්ඩ්‍යයන් සිය පසුපස ආරක්ෂක වළල්ල ලෙස යාපනය තෝරාගනිති. දෙමළ නොවූ රමේෂ්වරමේ විසූ ආර්‍ය්‍යචක්‍රවර්තීන්ට පාණ්ඩ්‍ය අනුහසින් යාපනයේ ප්‍රාදේශීය පාලනය ලැබෙන්නේ එවිටය. මුස්ලිම් ආක්‍රමණවලට බියෙන් දකුණු ඉන්දියානු ප්‍රභූ පවුල් එවා මේ යුගයේදී යාපනයට සංක්‍රමණය වෙයි.

පාණ්ඩ්‍ය රාජ්‍යය මුස්ලිමුන් විසින් පරාජය කිරීමත් සමග දකුණු ඉන්දියාවේ බලවත්වන්නේ විජයනගර් හින්දු රාජ්‍යයයි. ඔවුන්ද ආර්යචක්‍රවර්තීන් පෝෂණය කළ මුත් හයවැනි පරාක්‍රමබාහු හා සපුමල් කුමරු විසින් ආර්‍ය්‍යචක්‍රවර්තීන් හා ඔවුන්ගේ සහායක විජය නගර් බලවේග පරාජය කර ලංකාවේ ඒකීයභාවය ශක්තිමත් කරන ලදී. ඉන්පසු යාපනයේ ප්‍රාදේශීය පාලකයෝ කෝට්ටේ හෝ කන්ද උඩරට සිංහල රජවරුන්ට යටත් වූහ.

පෘතුගීසීන් මේ වනවිට ලංකාවට පැමිණ තිබූ නමුත් ඔවුන්ගේ පරම සතුරන් වූ මුස්ලිමුන් හා විජය නගර් අතර පැවැති ගැටුම් නිසා උපායක් ලෙස ආර්යචක්‍රවර්ති යාපනයට අත නොගැසූහ. නමුත් සංකිලි විසින් මන්නාරමේදී කතෝලිකරණය වූ දෙමළ ජනයා සමූලඝාතනය කිරීමෙන් පසු යාපනයට කඩා වැදුනාහ. සටනකින් තොරව නල්ලූර් සම්මුතිය (1594) මගින් යටත් වූ යාපනයේ ප්‍රභූවරු ඔවුනට යාපනයේ පාලනය ලබාදිනි. එය ආපසු ලබාගැනීමට සිංහල රජවරුන් ශක්තිමත් නොවූහ.

මෙලෙස පෘතුගීසීන් අතට පත්වූ යාපන ප්‍රාදේශීය පාලනයට වත්මන් නැගෙනහිර පළාතේ එක බිම් අඟලක්වත් අයත්ව නොතිබූ බව සැලකිය යුතුය.

සපුමල් කුමාරයාගේ සටන විජයග්‍රහණය. අවස්ථාවේදී යාපන පාලනයේ ඉදිරි ආරක්ෂක වළල්ල තිබුනේ වන්මන් පුනරීන්. පරන්තන් පුදේශවලවිම මෙයට ඇති වැදගත් නිදසුනකිනවද එවකට යාපන ප්‍රදේශය දක්වන සිතියමේ පවා වන්නිය හෝ නැගෙනහිර ඇතුළත් නොවීමෙන් ඒ කාරණය යළිත් ස්ථිර වේ.(පිලිප්ස් බෝල්දියස් - 1672 සිතියම)

පෘතුගීසීන් විසින් යාපනයේ දෙමළ ජනයා රඳවා ගැනීමේ කටයුත්තක නියැලුනේ නැත. එයට මුල පිරුවේ ලන්දේසීන් විසිනි. ජාවා හා මලයාවේ අත්දැකීම් අනුව යමින් ඔවුහු ලංකාවට වාණිජ වැවිලි හඳුන්වා දුන්හ. ලංකාවේ නිරිත දිග කුරුඳු වගාවද, යාපනයේ දුම්කොළ වගාවද ඇරඹූහ. ඒ සඳහා යාපනයට සමූහවශයෙන් දකුණු ඉන්දීය දෙමළ ජනයා ගෙන එන ලදී. පර්සිවෙල් (1805) නිරීක්ෂණ වලට අනුව එවකට යාපනයේ ස්ථිර පදිංචිකරුවන්ට **වඩා වැඩි පිරිසක් විදේශ (දකුණු ඉන්දියානු) සංක්‍රමණිකයන් සිටියේය.** ***(An Account of The Island of Ceylon)*** යාපනය තුළ සංවිධානාත්මක වාරි පද්ධතියක් (ලිං 80,000) ගොඩනංවනු ලැබුවේද එමගින් එහි මිනිස් ජනාවාස මහා පරිමාණයෙන් ඇතිවීමට තිබූ "ජල බාධකය" ඉවත් කළේද ලන්දේසීන් විසිනි. "දුම්කොළ පිබිදීම" නිසා ඇතැම් සංක්‍රමණිකයන් පසුව මඩකලපුවට සංක්‍රමණය විය. නැගෙනහිර දෙමළ ජනාවාසවලට පදනම එයින් ලැබිණි. තව දුරටත් සේවන - සේවක දුම්කොල වගා සම්බන්ධය නිසා යාපනය තුළ වෙල්ලාල - වෙල්ලාල නොවන ලෙස කුල පදනමක් වැටිනි. එය අරුමුග නාවලර්ගේ හින්දු පුනරජ්වනය විසින් 19 වන සියවස අගදී ස්ථිර සමාජ සබඳතාවක් කළේය.

ඉංග්‍රීසීන් විසින් සිංහලයන්ගෙන් එල්ලවූ යුද - දේශපාලන අභියෝග ජය ගන්නා ලද්දේ හැරින්ටන් න්‍යාය අනුව යමිනි. එය අයර්ලන්තය ඇද ගැනීමේදී ඉංග්‍රීසීන් කල යුද - දේශපාලන උපායකි. සී.බී. මැක්පියර්සන් මෙසේ කියයි. **"හැරින්ටන් (හා ලොක්) අයර්ලන්තයෙන් එංගලන්තයට ලැබෙන ඉතා සුළු ආදයම ගැන අවධානය යොමු කරවිය. එයට හේතුව ලෙස ඔහු දුටුවේ අයිරිෂ්වරුන්ගේ කුසිත සංස්කෘතියයි. ඒ නිසා ඔහු (හැරින්ටන්) අයර්ලන්තයේ ගොවිතැන හා වෙළදම සඳහා වඩාත් ශුරවූද වාණිජවාදී වූද, කිකරුවූද, යුදෙව්වන් යොද ගැනීමට යෝජනා කළේය.** ***( The Political Theory of possesive Individualism - 1962 - C.B. Macpherson )*** මේ අනුව ඉංග්‍රීසීන් ලංකාවේදී (මෙය බුරුමය, මලයාව, සුමාත්‍රාවේ ද සිදුවිය.) සිංහල බලය බිඳලීම සඳහා කන්ද උඩරට රාජධානිය වාණිජ වතුයායක් බවට පත්කළ අතර ඉන්දියානු කම්කරුවන් එහි ගෙන ආහ. පැරණි රජරට සිංහල රාජධානිය බිඳදැමීම සඳහා ඇතැම් වැව් විනාශ කළ අතර තවත් ඒවා දුම්කොළ ව්‍යාපාරිකයන්ට විකුණා එහි දෙමළ ජනාවාස ඇතිකරනු ලැබිය. වන්නියේ හා නුවර කලාවියේ දෙමළ ජනාවාසවල පදනම මෙයින් ඇතිවිය.

ටොරින්ටන් ආණ්ඩුකාරයා විසින් යටත් විජිත ලේකම් වෙත යවන ලද ලිපිවලින් පෙන්නාදෙන්නේ **1848 කැරැල්ල මර්ධනය කිරීම සඳහා උපකාර කළ දෙමළ ජනයා නැගෙනහිර පළාතේ පදිංචි කිරීමට අවසර ඉල්ලා සිටීමය.** ***(The Rebelion - 1348 - K.M.D. Silva Pg 98 -112)*** එමෙන්ම වෝඩ් ආණ්ඩුකාරයා විසින් 1858 සිට කෝපි හා දුම්කොළ වගාවට පැමිණි දෙමළ ජනයා නැගෙනහිර වාරි ප්‍රදේශවල පදිංචි කරන ලදී. 1832 මැයි 5 ද සිට සිංහල බෞද්ධ පූජනීය ස්ථානවල අයත් ඉඩම් වසර 99 ක බදු පදනම මත අසිංහලයන්ට මිළදී ගැනීමට ඉඩසලස්වන ලදී. 1857 ජුලි 27 දරණ නියෝගයකින් පැරණි සිංහල ඉඩම් අක්කරය රුපියල් තුන හා පග දක්වා වූ මිල ගණන්වලට අසිංහලයන්ට විකුණන ලදී. මෙය 1861 දී නැගෙනහිරට පත් වූ ජේ.ඩබ්. බර්ච් දිසාපති විසින් හරයේ ක්‍රියාත්මක කිරීම නිසා නැගෙනහිර මුහුදු බඩ ප්‍රදේශවල ඉඩම් අයිතිය අසිංහලයන් අතට පත් විය. අඩුම තරමින් 1831 - 1881 අතර දෙමළ ජනයා 40,000 ක් පමණ කෙලින්ම දකුණු ඉන්දියාවෙන්ද යාපනයේ දුම්කොළ වගා බිම් හා කඳු කරයේ කෝපි වගා බිම් අතිරික්තවලින්ද ගෙනැවිත් පදිංචි කරවන ලදී.

මේ අතර සිංහලයින් ආර්ථික අතින් තව දුරටත් දුර්වල කිරීම සඳහා වාණිජ හා මූල්‍ය කටයුතු අසිංහල චෙට්ටියාර්ලාටත්, තොග හා සිල්ලර වෙළෙදම අසිංහල දෙමළ හා මුස්ලිම් ව්‍යාපාරිකයනටත් පවරන ලදී. ඔවුන් පෙරළා නැගෙනහිර, කඳුකර හා වන්නියේ ඉඩම් මිලදී ගත්හ.

මේ අතර වන්නිය හා නැගෙනහිර ඇතැම් ප්‍රදේශවල ජීවත්වූ සිංහල ජනයා පළවාහැරීමට හා දෙමළකරණයට ලක්විය. මේ ගැන කදිම විස්තරයක් ත්‍රිකුණාමලයේ උප දිසාපති ලෙස කටයුතු කල සී.එම්. ලසින්ටන්ගේ වාර්තාවකින් පෙනේ. ***(1898 - Ceylon Administration Report - Part 1, Pg F - 7)***

**කුඩුකුලම පත්තුව (පදවි සිරිපුර, ගෝමරන්කඩවල, මොරවැව හා කුච්චවේලි ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය) "මේ ප්‍රදේශය කඳුරට සිංහලයින් ගේ ජනාවාසයකි. නමුත් ඔවුහු දන් වේගයෙන් විනාශවෙමින් හා දියැවියමින් සිටිත්. බොහෝ වැව් නැවත පුනුරුත්තාපනය කර හෝ අතහැර දමා ඇත. ඔවුනතර උඩරට රීති චාරිත්‍ර බොහෝවෙත්. ඇතැමෙක් සිංහල මෙන්ම දෙමළ භාෂාද කතා කරත් ප්‍රදේශයේ එකම පාසලේ සිටින්නේද දෙමළ ගුරුවරයෙකි. මේ නිසා දරුවෝ දෙමළ උගනිත්. රජයේ කාර්යාලවල සිටින්නේද දෙමළ උගත්තුය. මේ නිසා සිංහලයෝද ක්‍රමයෙන් දෙමළ නම් ගම් ගනිමින් පාරම්පරික සිංහල නම් අත්හරිමින් සිටිත්. මේ අවාසනාවන්ත තත්වය මග හැරවීම සඳහා වහාම සිංහල ගම් ප්‍රධානියෙක් පත්කළ යුතු අතර දෙමළ පාසැල වසා දැමිය යුතු යැයි නිර්දේශ කරමි".**

මෙයින් පෙනීයන්නේ යාපනයේ සිදුකළ ඉංග්‍රීසි අධ්‍යාපනයෙන් උගත් නිලධාරීන් අධිකරණ හා කච්චේරි පරිපාලනයට ද, පාසැල් වලටද යොදගැනීම නිසා උතුරේ හා නැගෙනහිර ඉතුරුව තිබුණු සිංහල ගම්මාන පවා දෙමළ ග්‍රාමම් බවට පත්වූ අනුවේදනීය ආකාරයයි.

මෙවැනිම නිරීක්ෂණයක් එෆ්. ඩී. ඒ. වින්සන්ට් විසින් ද කර ඇත. ***(Forest Administration of Ceylon - Chapter I, Page 2 Sessional paper 43 of 1882)***

**"නැගෙනහිර පළාතේ වෙරළ තීරය ඔස්සේ දෙමළ ජනයා ව්‍යාප්ත වන වේගය දනෙන සුළුය. දෙමළ හා මුසුල්මානුවන් පදිංචි වීම සඳහා පැමිණෙන විට සිංහල ගැමියෝ වඩ වඩාත් රට තුළ කැළෑවට වැදෙත්. හේන් ගොවිතැන ඔවුන්ගේ ජීවිකාව බවට පත්වෙත්....."**

1921 ජනගහණ සංඛ්‍යාලේඛණ ගැන අදහස් දක්වන මඩකලපුව කච්චේරියේ නිලධාරියෙකු වන එස්. ඕ. කනගරත්නම් මෙසේ ලියා ඇත.

**"මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉතාම කනගාටුදයක සිදුවීම වන්නේ වියැකී යන සිංහල ජනාවාසයන්ය. එය විශේෂයෙන් දකුණේ හා බටහිර සිදු වේ. එක් කලෙක එකී සාරවත් පිබිදෙන සිංහල ගම්මාන තිබිණි. තවමත් ඒවායේ නටබුන් හැඩින් හැන ඇත....." මුළු දිස්ත්‍රික්කයම කන්ද උඩරට රාජධානියේ කොටසක් වූ අතර සිංහල රජුන් එය හඳුන්වාදී ඇත්තේ පුලියන්දුව ලෙසිනි....."** ***(Monograph of the Batticalo district of the eastern province - 1921 - Pg. 102)***

මෙලෙස ඉංග්‍රීසින් විසින් ආරම්භ කරන ලද නැගෙනහිර වෙරළ තීරවල දෙමළ ජනාවාස ක්‍රමයෙන් රටතුළටද කාවැදෙමින් පැමිණියහ. ඉන්පසු ගල්ඔය හා මහවැලි ව්‍යාපාර යටතේ ද නව පරම්පරාවල දෙමළ ජනපද ඇතිවිය. 1981 සංඛ්‍යාලේඛණ අනුව ගල්ඔය ව්‍යාපාරයේ වම්ඉවුරේ දෙමළ ජනයා 42,114 ක්ද, දකුණු ඉවුරේ 5,975 ක්ද ගග බෙදුමේ 41,085 ක්ද වාසය කළහ. මහවැලි ව්‍යාපාරය යටතේ බී කලාපය තුළ මාදුරු ඔය වම්ඉවුර (නියම්ගම් වැලිකන්ද, මනම්පිටිය හා අරලගන්විල) තුල පවුල් 21,248 ක්ද මාදුරු ඔය දකුණු ඉවුර (නියම්ගම් සිද්ධපුර, රන්දියපුවර) තුළ පවුල් 13,330 ක්ද පදිංචි කිරීමට අදහස් කරගෙන තිබිණි. දිඹුලාගල හිමියන් විසින් මාදුරු ඔය වම් ඉවුරේ සිංහලයින් පදිංචි කළ අතර එවකට ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් ඔවුන් බලයෙන් ඉවත් කරනු ලැබිය. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ඇමති දේවනායගම් විසින් මාදුරු ඔය දකුණු ඉවුරේ ඉඩම් දෙමළ ජනයා යොද අල්ලා ගන්නා ලදී. මෙය කෝරලේපත්තු ප්‍රාදේශිය ලේකම් ප්‍රදේශයේ දෙමළ ජනගහනයක් ඇතිවීමට හේතුව විය. නැගෙනහිර පළාතේ වෙරළ තීර හැරුණු විට රටමැදට විසිරීගිය අස්වාභාවික දෙමළ ජනගහණයක් ඇති වීමට එය හේතු විය. (1981 ජන සංගණනය අනුව එහි සිංහල ජනගහණය 1496 ක් වනවිට දෙමළ ජනගහණය 31806 ක් විය. 2001 දී ගි සංගණන කටයුතු නිසි පරිදි සිදු නොවිය) මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වල මෙන් මඩකලපුවේද මහවැලි ඉඩම් වල ඉන්දියානු දෙමළ ජනයා සංවිධානාත්මකව 1977 සිට පදිංචි කර ඇති අතර කෝරල පත්තු මාන්කෙයි හා පෝරතිව් වල මෙකී ජනපදකරණය සිදුවී ඇත. (නැගෙනහිර පළාත 1981 ජනගහණ තොරතුරු මත සිතියම බලන්න රූපය 8)

(වන්මන් නෝර්වේ තානාපති ජෝන් වෙස්ට්බර්ග් ගානඩියම් හා ටී. ආර්. ආර්. ඕ. ව්‍යාපාර හා එක් වී මන්නාරම මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි කරන ලද ඉන්දියානු දෙමළ ජනපදකරණය චිර ප්‍රසිද්ධය. එය 1971 හා 1981 මුලතිව්, වවුනියාව දිස්ත්‍රික්ක වල ජනගහණය ව්‍යාප්තියෙන්ම පෙනේ. 1971 දී ඒ දිස්ත්‍රික්කවල ඒකාබද්ධ ජනගහණය 73,010ක් විය. ජනගහණ වර්දනය 2% ක උපරිමයක්ලෙස ගත්තද 1981 දී එය විය යුත්තේ 88,998ක් පමණය. නමුත් එහි 1,43,803ක් ජනගහණය විය. අඩුම තරමින් 1978 - 1981 අතර ජනාවාස කරන ලද ප්‍රමාණය 54,805ක් වේ. ඉන්පසුවද මෙය කෙරීගෙන ගිය අතර ඒ පිළිබඳව නිශ්චිත සංඛ්‍යා ලේඛන නැත. මඩකලපු දිස්ත්‍රික්කයේද මාදුරුඔය ගොවිබිම් වල මෙය සිදුවිය. කොටි සංවිධානයේ ප්‍රධාන යුද මූලකඳවුරු වන මල්ලාවි (මන්නාරම) මුලතිව් හා තොප්පිගල ගොඩනැගී ඇත්තේ රෙඩ්බානා හා නෝර්වේ විසින් ගොඩනංවන ලද මේ ඉන්දියානු දෙමළ ජනපද නිසාය.කොටි සංවිධානයේ පිරිස් බලය මුළුමනින්ම වාගේ නැගෙනහිර හා වන්නියේ බිහිකළ ඉන්දියානු හා කුලහීන ඩාලිට් ජනයාගෙන් හැනී තිබේ. මේ නව ඉන්දියානු දෙමළ ජනපද මිෂනාරි ව්‍යාපාරයේද තෝතැන්නකි. කොටින්ගේ නවපරපුරුවල නායකත්වය මොවුන්ගෙන් හැනී තිබේ.)

## නැගෙනහිර : මුස්ලිම් ව්‍යාප්තිය

දි ක්වෙරෝස් පියතුමා මෙලෙස ලියා ඇත... **"පෘතුගීසින් විසින් (කොන්ස්ටන්ටයින් ද සා) මුස්ලිම්වරුන්ව 1626 දී පළවා හරින ලදී. කන්දඋඩරට සෙනරත් රජු ඔවුන්ව ඔහුගේ රාජධානියට අයත් ප්‍රදේශවල (වර්තමාන අම්පාර, මඩකලපුව මුහුදු තීරයේ) පදිංචි කරන ලදී. පිළිමවන්දනා කරන රජු විසින් (ඉස්ලාම් දහම පිළිම වන්දනාව පිළිකුල් කරත්) මුසුල්මානුවන් 4000ක් මඩකලපුවේ පදිංචි කරන ලදී..*(Temporal and spiritual Conquest of Ceylon Page 754)*** ඇතැම් මුස්ලිම් අන්තවාදීන් නැගෙනහිර පළාතේ තම බලය ගොඩනැංවීම සඳහා ඔවුනට එහි වසර දහස් ගණනක ඉතිහාසයක් ඇති බවට ව්‍යාජ ප්‍රකාශ කරති. (ඒ. එච්. එම්. අෂ්රෆ් විසින් ප්‍රකාශ කරන ලද අම්පාර මුස්ලිම්වරුන්ගේ උරුමය නැමැති කෘතිය එවැන්නකට උත්සාහ දරා ඇත.)

අරාබි වෙළෙඳුන් බොහෝ කාලයක සිට ගනුදෙනු කිරීම සඳහා ලංකාවට පැමිණියද තිර මුස්ලිම් ජනාවාස ඇතිවූයේ සෙනරත් රජු නිසාය. පරම්පරා තුනක් ඇතුළත සිංහල සංස්කෘතියට ඇතුළු වීමට ඔවුන් සෙනරත් රජුට පොරොන්දු වූ නමුත් එය ඉටු වූයේ නැත. 1817 - 18 සිංහල විමුක්ති අරගලය පාගා දැමීම සඳහා හාජ් නෙයින මරික්කාර් ඇතුළු මුස්ලිම් ප්‍රභූවරු ඉංග්‍රීසින්ට උපකාර කිරීම නිසා ඔවුන්ගේ ව්‍යාප්තියට ඉංග්‍රීසින්ගෙන්ද රුකුල් ලැබිණි. ඊජිප්තු මුස්ලිම් මූලධර්මවාදියෙකු වූ ඔරාබි පාෂා විසින් නැගෙනහිර මෙන්ම මුළු ලංකාවේම මුස්ලිම්වරුන් ජාතිකත්වය අභිබවා මුස්ලිම් සහෝදරත්වයකට එක් කරන ලදී. නමුත් ඇතැම් නැගෙනහිර මුස්ලිම් නායකයන් අතර තමන් කෙලින්ම අරාබි යෝනක පරපුරු වලින් පැවතෙන බවට මතවාදයක් විය. (මෙය ඉදිරිපත් කළේ සර් රසීක් ෆරීඩ්ය) මේ නිසා රටේ සෙසු ප්‍රදේශවල මුස්ලිම් ජනයා මෙන් නොව තමනට කෙළින්ම අරාබි මුතුන්මිත්තන්ගේ පරම්පරාව ඇතැයි නැගෙනහිර මුස්ලිම් ප්‍රභූවරු විශ්වාස කරති. තවත් මුස්ලිම් මූලධර්මවාදීන් පිරිසක් තම අතීත මූලයන් ඉන්දියාවේ මුස්ලිම්වරුගෙන් පැවත එන බව විශ්වාස කරති.

1931 දී ඉන්දියාවෙන් වෙන්වී වෙනම ස්වෛරී මුස්ලිම් රාජ්‍යයක් ගොඩනැගීමට අලාමා ඉක්බාල් යෝජනා කරද්දී, ඔක්ස්ෆර්ඩ් බුද්ධිමතකු වූ රහමත් අලිචෞද්රි විසින් එහි භූමි ප්‍රදේශ සටහන් කරන ලදී. ලංකාවේ මුස්ලිම්වරුන්ද ඉන්දිය මුසුල්මානුවන්ගේ කොටසක් ලෙස සැලකූ ඔහු ලංකාවේ නැගෙනහිර නසරිස්තානය නමින් වෙනම රටක් ඔවුනට යෝජනා කළේය. (බස්නාහිර විසුවන්ට සපිස්තානය යෝජනා විය) (රූපය 9) ඒ පිළිබඳව යම් අදහසක් හෝ ඉදිරිපත් කලේ

ඉදිරිපත් කලේ අග්නිදිග මුස්ලිම් කලාපය නමින් ඒ. එච්. එම්. අෂ්රෆ්ය. (1986) නමුත් වහබ්මන් මුස්ලිම් මූලධර්මවාදයේ වනාප්තිය ඉදිරියේ නසරීස්තානය පිළිබඳ අදහස යලිත් මතු වී ඇත. අරාබි - ඇෆ්ගනිස්තානු ප්‍රදේශයන්ද, ඉන්දුනීසියා - මලයා ප්‍රදේශයන්ද මුහුදින් හා ගුවනින් යාකරන නව වරායක්, ගුවන් තොටක් සහිත බහරේනයක් හෝ අබුඩාබියක් පිළිබඳව සිහිනයක් මුස්ලිම් අන්තවාදයට ඇත.

දෙමළ නාසිවාදී කොටි ප්‍රහාර නිසා තමන්ගේම වූ වෙනම හමුදවක් හා පාලනයක් අවශ්‍යයැයි කියන තැනට සාමාන්‍ය මුස්ලිම් ජනයා පවා තල්ලු කරවන්නට ඔවුන් සමත්ව සිටී.

1981 හා 2001 ජනසංඛ්‍යාලේඛණ දෙස බලන විට නැගෙනහිර මුස්ලිම් වනාප්තිය මඩකලපුව පමණක් නොව ත්‍රිමලයේද සිදුව ඇත. කන්තලේ හා හබලගමුව උදහරණ වේ. (රූපය - 10 - නැගෙනහිර මුස්ලිම් වනාප්තිය)

---

## නැගෙනහිර සිංහලයෝ

නැගෙනහිර සිංහල ඉතිහාසය වසර දහස් ගණනක් පුරා දිවයන්නකි. පුරාවිද්‍යාත්මක, වංශකතානුකුල, වාගවිද්‍යාත්මක, භූගෝලීය හා ජනගහණමය කරුණු අනුව එය සැකයකින් තොරව ඔප්පු වේ. නැගෙනහිර සිංහලයින්ගේ ආර්ථික පදනම වූයේ ගොවිතැනය. යාන්ඔය, මහවැලි ගඟ, මාදුරු ඔය හා ගල්ඔය ප්‍රධාන දියදහරා එය පෝෂණය කළේය. මහවැව්, කුඩාවැව් හා කුළුවැව් දහස් ගණනකින් එය පෝෂණය විය. එහි සිංහල ශිෂ්ඨාචාරයට මරු පහරක් තීරකව එල්ල වුණේ මාඝ ආක්‍රමණිකයාගෙනි. විශේෂයෙන් වාරි කර්මාන්තය අඩපන වීම ජනගහණ වර්දනයට බලපෑවේය. 1766 දී ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ ලබා ගන්නා තෙක් සිංහලයෝ මුළු නැගෙනහිරම වාසය කළහ. ලන්දේසි යුග වලදී ආරම්භ වී ඉංග්‍රීසි යුගවලදී උච්ජස්ථානයට පත්වුණු දෙමළ ජනපදකරණය ඊළගට සිංහලයින් තවත් දුර්වල කළේය. 1817 - 18 සිංහල විමුක්ති අරගලය නිසා විශේෂයෙන් බින්තැන්නේ හා පානම පත්තුවේ සිංහල සංහාරයක් සිදුවිය. ඉන්පසු මුස්ලිම් වනාප්තිවාදය ඇතිවිය. මේ සියළු තත්වයන් තුළ පවා 1981 දී නැගෙනහිර පලාතේ සිංහලයින්ට එහි ඉඩම් වලින් 52% ක් හිමිව තිබිණි. (කඩුකුලම පත්තුව බටහිර හා සේරුවිල (ත්‍රිමලය) - බින්තැන්න පත්තුව, වැව්ගම්පත්තුව, පානමපත්තුව - (අම්පාර) සිංහල බහුතර ප්‍රදේශ විය.) දෙමළ ජනයා 1921 දී විසිර සිටියේ වෙරළ තීරයේ පමණි. (රූපය - 11)

1949 දී දෙමළ රාජ්‍ය පක්ෂය චෙල්වනායගම් පිහිටුවීමත් සමග නැගෙනහිර සිංහලයින්ට එරෙහි සංවිධානාත්මක ප්‍රහාර ඇරඹින. 1951 දී දෙමළ රාජ්‍ය පක්ෂයේ සමුළුව ත්‍රිමලයේ පැවැත්වීමත්, අවුරුදු තුන් දහසක සිට නැගෙනහිර පාලනය කළේ දෙමළ රජවරුන් බව චෙල්වනායගම් ප්‍රකාශ කිරීමත් සමග සිංහලයින් ගැන වෛරය ඇති කරනු ලැබිය. චෙල්වනායගම් මෙසේ කියා ඇත. " **දෙමළ ජනයා මේ නිම්නයේ වසර 3,000ක් ජීවත් වී ඇත. කිසිම සිංහල රජෙකු මේ දෙමළ භූමියට අත තැබීමට බියවූහ. එහෙත් නූතන සිංහල ආණ්ඩු අපේ ඉඩම් පැහැර ගනිමින් ඇති අතර ඒවා ආපසු ගැනීම අප විසින් කළ යුතුය.** " (1955 ජූලි 15ද) දෙමළ ඉඩම් සිංහල ආක්‍රමණිකයාගෙන් බේරාගැනීම සඳහා යැයි කියමින් චෙල්වනායගම් හා වන්නියසිංගම් 1957 දී සංවිධානාත්මක ප්‍රහාර සිංහල ගම්මානවලට එල්ල කළහ. සිංහල විරෝධී කෝලාහල වල ප්‍රතිඵල ජනසංඛ්‍යාලේඛන වලින් පෙනින. උදහරණයක් ලෙස 1946 දී මඩකලපුවේ සිංහල ජනගහණය 11850 ක් විය. 1957 සිංහල විරෝධී ප්‍රහාර වලින් පසු 1963 දී එය 6580 ක් විය. 2001 දී මඩකලපුවේ සිංහල ජනගහණය 2,289 කට සීමා වී තිබේ.

සාමූහික කෝලාහල, සංවිධානාත්මක සිංහල විරෝධී ජනපද වලට අම්තරව සිංහල සමූහ ඝාතන ආරම්භ කරන ලදී. 1977, 78 සිංහල විරෝධී කෝලාහල නිසා සැලකිව යුතු සිංහල ජනතාවක් නැවත නොඑන්නට උතුරු හා නැගෙනහිර හැර ගියහ. උදහරණයක් ලෙස 1971 දී යාපනයේ සිංහල ජනතාව 20402 ක්වූ අතර 1981 දී එය 4615 දක්වා අඩුවිය. 1984 නොවැම්බර් 30 වැනිද සිට උතුරු හා නැගෙනහිරින් සිංහලයින් අතුගා දැමීමේ සමූහ සංහාර දෙමළ නාසිවාදය ආරම්භ කළේය.

**නව සමූහ සංහාරවටය ආරම්භවීමට පෙර 1981 නැගෙනහිර පළාතේ ජනගහණ තොරතුරු මෙසේය.**

1981 නැගෙනහිර පළාත වර්ග කිලෝමීටර 9633 ක් විශාලවන අතර උප දිසාපති කොට්ඨාශ 27 කින් සමන්විත විය. එයින් 9 ක් සිංහල බහුතර ප්‍රදේශ විය. ගෝමරන්කඩවල, මොරවැව, කන්තලේ, සේරුවිල, පදියතලාව, මහඔය, වැව්ගම්පත්තු උතුර හා දකුණ, දමන, ලාහුගල ඒ ප්‍රදේශ වියඑයට වර්ග කිලෝමීටර 4988 ක් හෙවත් 51.8% ක් අයත් විය.(1982 සිට එයට පදවි සිරිපුර ද එක්විය). දෙමළ බහුතරය සහිත උපදිසාපති කොට්ඨාශ 8 ක් විය. එයට වර්ග කිලෝමීටර 2999 ක් හෙවත් 31% ක ඉඩම් හිමිව තිබිණි. මුස්ලිම් බහුතර කොට්ඨාශ 07 ක් වූ අතර එයට වර්ගකිලෝමීටර 910 ක් හෙවත් 9.6% ක ඉඩම් හිමිව තිබිණි. කිසිවෙකුට හෝ බහුතරය නැති උප්දිසාපති කොට්ඨාශ 03 ක් වූ අතර එයට ව.කි.මී. 736 ක් හෙවත් 7.6% ක ඉඩම් අයිතිය තිබිනි. මේ අනුව 1981 සංඛ්‍යාලේඛන අනුව සිංහලයින් 255,448 ක් වාසය කළ අතර ඔවුන්ට අඩුම තරමින් නැගෙනහිර පළාතේ ඉඩම් වලින් 53% ක් හිමිව තිබිනි.

1984 න් පසු එකතැන 6 දෙනෙකුට වඩා මරා දමුණු සමූහ සංහාර 100 ක් නැගෙනහිර පළාතේ සිදුවිය. එයින් 40 ත්‍රිමලයෙන්ද, 17 මඩකලපුවේද, 43 ක් අම්පාර දිස්ත්‍රික්ක වලද සිදු විය. පුද්ගලයින් 6 දෙනාට වඩා අඩුවෙන් කළ මරා දැමීම් හා ප්‍රහාර 4000 ක් පමණ වාර්තා වී ඇත. (12 වන රූපය බලන්න)

මේ ප්‍රහාර නිසා ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්ක වල පමණක් 86350ක් අනාථයින් බවට පත්වී ඇත. (එකී ගණනයන් වලදී මේ ප්‍රදේශවල සිංහල ජනගහණය 2% ක වාර්ෂික වේගයකින් වර්දනය වේ යැයි උපකල්පනය කර ඇත. සමස්ත ශ්‍රී ලංකාවේ 1961 දී වර්ධන වේගය 2.7 ක් වූ අතර 1980 දී එය 2.0 දක්වාද 2001 දී 1.1% දක්වාද අඩුවී ඇත. නමුත් වියලි කලාපීය ප්‍රදේශවල වර්දන වේගය තවමත් 2% තත්වයේ තිබේ. එවැනි ගණනයකින් අම්පාර දිස්ත්‍රික්කයේ අනාථයින් සෙවිය නොහැක්කේ මහවැලි පදිංචි කිරීම් යටතේ 1981 න් පසුවද එයට සංක්‍රමණ සිදුවූ නිසාය.) (13 වන රූපය බලන්න)

2001 ජුනි ජනසංඛ්‍යාලේඛන අනුව නැගෙනහිර පළාතේ තවමත් සිංහලයින්, අම්පාර 2, 31, 771 ක්ද, මඩකලපුව 2439 ක්ද ත්‍රිකුණාමලයෙන් 77312 ක්ද ලෙස 311522 ක් වාසය කරයි. ඔවුනට තවමත් නැගෙනහිර පළාතෙන් වර්ග කිලෝමීටර 4898ක් හෙවත් 50% ක් හිමිය. මෙය බස්නාහිර පළාතටත් (ව. කි. 3684) වඩා විශාල ප්‍රමාණයකි. බලන්න ඉඩම් අයිතිය පිළිබඳව රූපය 14, හා සිංහල ව්‍යාප්තිය රූපය 15- සිංහල හා මුස්ලිම් ජ්‍යාබද්ධ ව්‍යාප්තිය රූපය 16) එහෙයින් නැගෙනහිර පළාත දෙමළ නාසිවාදීන්ට ලබාදෙන්නේ කුමන පදනමකින්ද?

# දෙමළ නාසිවාදී කොටි ත්‍රස්තවාදයට නමින් හෝ නොනමින් අන්තර්පාලනය හෝ පෙඩරල් රාජ්‍යය ගියහොත්?

## උතුරු හා නැගෙනහිර දෙපළාත එක් කිරීම

1987 ජූලි 29 වැනිද ඇති වූ ඉන්දුලංකා ගිවිසුමෙන් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති හා යූඑන්පී. ආණ්ඩුව වසරක කාලයක් සඳහා උතුරු හා නැගෙනහිර දෙපළාත එක්කරන ලදී. ඒ කරන ලද්දේ උතුරට එක්වනවාද නොවනවාද යන්න නැගෙනහිරට තීරණය කිරීමට ජනමත විමසුමක් තබන බවට පොරොන්දු වෙමිනි. එය සිදු කළේද හදිසි නීතිය යටතේය. එමෙන්ම එම ගිවිසුම මඟින් උතුරු හා නැගෙනහිර දෙමළ ජනයාගේ ඓතිහාසික වාසභූමිය ලෙසද පිළිගන්නා ලදී. උතුරු හා නැගෙනහිර එක්කර පළාත් සභාවක්ද තනන ලදී. (1988) නමුත් නැගෙනහිර වෙන් කිරීමේ ජනමත විචාරණය කිසිකලෙක නොපැවැත්වූ අතර ජ්‍යාබද්ධ උතුරු නැගෙනහිර පළාත් සභාවේ දෙමළ පාලනය (EPRLF) පෙන්නා දුන්නේ දෙමළ ආධිපත්‍යයකට යටවීමෙන් සිංහල හා මුස්ලිම් ජනයාට කවර ඉරණමක් අත්වේද යන්නය.

ඊලඟට 2001 වසරේ සිට හදිසි නීතියද ඉවත්වූ අතර දැන් උතුර හා නැගෙනහිර ජ්‍යාබද්ධද නැතිද යන්න පිළිබඳව තීරණය අධිකරණයට භාරව තිබේ.

පළාත් සභා අවස්ථාවේදී උතුරු හා නැගෙනහිර එක් පළාතක් ලෙස අවධාරණය කරන නමුත් මහා මැතිවරණ වලට මන්ත්‍රීන් බෙදන්දී එය දෙපළාතක් ලෙසම සලකනු ලැබේ. අපේ ව්‍යවස්ථාවේ 96 - 4 වගන්තිය අනුව ජාතික ලැයිස්තුවේ 29 දෙනාට අමතරව එක් පළාතකට 4 බැගින් 36 දෙනෙකු මන්ත්‍රීන් පළාතකට ලැබේ. මේ අනුව උතුරට 4 ක් හා නැගෙනහිරට 4 ක් ලැබේ. එහෙනදී උතුර හා නැගෙනහිර වෙනවෙනම පළාත් ලෙස සැලකීමට දෙමළ ජනවර්ගවාදය එරෙහි නොවන්නේ එමගින් ඔවුනට වැඩිපුර මන්ත්‍රීධුර 4 ක් පාර්ලිමේන්තුවේ ලැබෙන නිසාය. (අනුපාත ක්‍රමය අනුව ආසන 160 ක් ඒ ඒ දිස්ත්‍රික්ක වල - මැතිවරණ කොට්ඨාශ - ඡන්දදායක ප්‍රමාණය අනුව බෙදිය යුතු වන අතර එවැනි ඡන්දදායක ප්‍රමාණයක් භෞතිකව වාසය නොකරන යාපනය හා වන්නි දිස්ත්‍රික්ක වලට ආසන 11 ක් ලැබී තිබේ. මේ සඳහා ඡන්ද ලක්ෂ 8 ක් පමණ අවශ්‍ය වුවත් - උදා: කළුතර - ඡන්ද ලක්ෂ 4 කට පමණ ඒ වාසිය උතුරට ලැබී තිබේ. එමගින් අඩුතරමින් පාර්ලිමේන්තුවේ ආසන 9 - 10 ක් පමණ දෙමළ ජනයාට වැඩියෙන් ලැබී ඇත.) මෙය ආණ්ඩු බලය කේවල් කිරීමට තරම් ප්‍රමාණයකි.

මේ නිසා නීතිය ඉදිරියේදී තමන්ට වාසිවන විට උතුර හා නැගෙනහිර එකක් ලෙස සැලකීමත් තවත් අවස්ථාවලදී වාසිය තකාම එය දෙකක් ලෙස සැලකීමත් පෙන්නා දෙන්නේ දෙමළ ජනවර්ගවාදයේ අවස්ථාවාදය හා චපලකමය.

## ජ්‍යාබද්ධ කමිටු

ලංකා ආණ්ඩුව, කොටි සංවිධානය හා මුස්ලිම්වරු නියෝජනය කරමින් උතුරු හා නැගෙනහිර දෙපළාතේ සංවර්ධනය සඳහා ජ්‍යාබද්ධ කමිටුවක් පිහිටුවීමට ක්‍රියා කරගෙන යයි. මුලින් ජ්‍යාබද්ධ කාර්ය බලකායක් පත් කිරීමට ගියත් එය ව්‍යවස්ථානුකූල කිරීමට පාර්ලිමේන්තු බලය අවශ්‍ය වූ නිසා ආණ්ඩුව හා කොටි ඒ අදහස අත්හැර දැම්මෝය. දැන් ආරක්ෂාව, දේශපාලන තීන්දු හා පුනරුත්ථාපනය සඳහා කමිටු තුනක් පත්කර ඇත.

මෙයට අරමුදල් සපයන්නේ ලෝක බැංකුවයි. උතුරු හා නැගෙනහිර සහනාධාර, පුනරුත්ථාපනය හා නැවත පදිංචි කිරීම් සඳහා වසර තුනක කාලයකට රුපියල් කෝටි 8600 ක් වැයකිරීමට සැලසුම් කර ඇත. දැනටමත් ඉදිරි කෙටිකාලය සඳහා රුපියල් කෝටි 250 ක් (US $ 26 මිලියන) ලබාදී ඇත. එය ලබාදී ඇත්තේ මහවැලි සංවර්ධනයට හා පුද්ගලික අංශයේ යටිතල පහසුකම් සංවර්ධනයට යොදවා තිබූ මුදල් වලිනි ! මෙයින් පෙනී යන්නේ අමුතුවෙන් ණය ආධාර නොලැබෙන අතර දකුණ සංවර්ධනයට තිබූ මුදල් උතුර හා නැගෙනහිරට යොමු කරවන බවය. එපමණද නොවේ. මේ මහා ණය මුදලින් ප්‍රදානයන් ඇත්තේ 4% කට ආසන්න ප්‍රමාණයකි. ඉතිරි මුදල් සියල්ලම (කෝටි 8250) ලංකා ආණ්ඩුව විසින් ගෙවිය යුතු ණයය. ඒවා අවසානයේ වියදම් කරන්නේ කොටි සංවිධානය හා එහි පෙරමුණු සංවිධානයක් වන දෙමළ පුනරුත්ථාපන සංවිධානයයි. (TRO) එනම් සිංහලයින් ණය කාරයින් කර කොටින්ට ඊළම තැනීමට අරමුදල් සැපයීමය. 2003 අයවැය ලේඛණය අනුව නැගෙනහිර පුනරුත්ථාපනයට කෝටි 47.6 ක්ද (හකීම් ඇමැති) වන්නි පුනරුත්ථාපනයට කෝටි 166 ක්ද (නූර්දීන් ඇමැති) උතුර පුනරුත්ථාපනයට කෝටි 399 ක්ද (ජයලත් ඇමැති) සිංහලයන්ගේ බදු මුදල් වලින් වෙන් කර ඇත. සිංහල පුනරුත්ථාපනයට එක සතයක්වත් වෙන් කර නැත.

මේ මුදල් කන්දරාව වැයකිරීමට යන එක් ක්ෂේත්‍රයක් නම් අනාථයින් පදිංචි කිරීමය. නිවැරදි ගණන් බැලීමක් කළහොත් උතුරු හා නැගෙනහිර දෙපළාතේ සිංහල අනාථයින් ප්‍රමාණය 153000 ක් පමණ වේ. (රූපය - 13) ඔවුන් නැවත පදිංචි කිරීමේ කිසිම සැලැස්මක් මෙයට අයත් නැත. මන්ද ජ්‍යාබද්ධ කමිටුවල සිංහලයින් නැති නිසාය.

තවද කොටි සංවිධානය දෙමළ ජනයා පදිංචි කිරීමට යන්නේ යුද්ධමය අරමුණු ඉටුකර ගැනීම සඳහාය. පළමුව උතුරු හා නැගෙනහිර ප්‍රධාන ආරක්ෂක කඳවුරු වල අධි ආරක්ෂක කලාප බිඳවැටෙන සේ දෙමළ ජනයා පදිංචි කිරීමට සැලසුම් කර ඇත. දැනටමත් යාපනයේ පලාලි හා කන්කසන්තුරේ අධි ආරක්ෂක කලාප වැසියන් ලෙස වන්නියෙන් ගෙන එන ලද 26,000 ක් පදිංචි කිරීමට සැලසුම් කරනු ලැබේ. මෙයින් පසු පලාලි අක්කර 80 කටද, කරෙයිනගරය අක්කර 32ක්ටද සීමාවූ කඳවුරු බවට පත්වේ. දෙවැනි පියවර වන්නේ ආරක්ෂක අතින් ඉතා වැදගත් සිංහල ගම්මාන කොටු වනසේ දෙමළ නව ගම්මාන ඉදිකිරීමය. මෙය විශේෂයෙන් වැලිඔය ජනපදය, වවුනියාව, පදවිය හා ත්‍රිමලයේ උතුරු ප්‍රදේශවලද, ත්‍රිමල නගරයේද මඩකලපුවේ කෝරල පත්තු වලද සිදු කරනු ඇත. රැලගට සිංහලයින් අත්හැරදමා ගිය ඉඩම් අල්ලා ගැනීම සිදු කරනු ඇත.

මෙකී පුනුරුත්ථාපන අරමුදලට කැනඩාව කර ඇති කොන්දේසියක් නම් තම ආධාර ලැබීමට ලංකාව බිම්බෝම්බ නොඇටවීම පිළිබඳ ඔටාවා සම්මුතිය අත්සන් කළ යුතු බවයි. මෙය අත්සන් කිරීමට ශ්‍රී ලංකා රජය ක්‍රියා කරගෙන යයි එවැනි සම්මුතියකට කොටි සංවිධානය බැඳී නැත. එමගින් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල රැකවරණය සහමුලින් බිඳවැටේ.

## අන්තර් පාලනය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 - ඔ වගන්තිය යටතේ පළාත්සභාවක් පිළිබඳ දුෂ්කර තත්වයක් මතුවූ විට විධායක ජනාධිපතිට එකී පළාත සඳහා අන්තර්වාර පාලනයක් ලබාදිය හැකිය. එයට පළාත් සභා බලතල ඉක්මවිය නොහැකි අතර එසේ කරන්නේ නම් ව්‍යවස්ථා සංශෝධනයකට යායුතු වේ. 1987 ඉන්දු-ලංකා ගිවිසුමෙන් පසුවද අන්තර්වාර පාලනයක් ඇති කිරීමට ජයවර්ධන ජනාධිපති හා ඩික්සිත් උත්සාහ කළ අතර එහි පූර්ණ බලය තමන්ට ලැබිය යුතු යැයි කොටි කළ උද්ඝෝෂණය (තිලීපන් උපවාසය) නිසා එය පිහිටුවීමට නොහැකි විය. 1999 දී චන්ද්‍රිකා ජනාධිපතිනිය හමුදා හා සිවිල් නිලධාරීන් යොදවා එවැන්නක් පිහිටුවුවාය.

ව්‍යවස්ථානුකූලව අන්තර්වාර පාලනයක් ලබාදුනහොත් හා එය කොටි විසින් පිළිගතහොත් එයින් ඔවුන් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව පිළිගන්නා බව කියැවෙන බවට වූ රනිල්වික්‍රමසිංහ මතය දන්තුරු කැවෙන විහිළුවකි. කොටි සංවිධානයට 1989 දී ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රුපියල් මිලියන 96 ක් ලැබුණු අතර වැලිඔය ශ්‍රී ලංකා හමුදා කඳවුරෙන් අවි තොගයක් ලැබිණි. ඔවුන් ඒවා භාර ගැනීමෙන් පෙනීගියේ ඔවුන් ලංකාවේ මහ බැංකුව හා හමුදාව පිළිගන්නා බවක්ද?

පළමු කාරණය නම් ව්‍යවස්ථාවේ මොනවා සඳහන් වුවත්, ඒවා උතුරු හා නැගෙනහිර ක්‍රියාවට නැංවීමට ලංකා ආණ්ඩුව අපොහොසත් හෝ අකමැති වී ඇති බව පසුගිය කෙටිකාලය පෙන්නා දුන් බවය. එපමණක් නොවේ අන්තර්පාලනය අවි ආයුධ සහිත කොටි සංවිධානයට ලබාදෙන නිසා එහි ක්‍රියාත්මකභාව තීරණය කරන්නේ ලංකා ආණ්ඩුව නොව අන්තිමේදී කොටි සංවිධානයයි. ඇත්තෙන්ම රනියා අන්තර් පාලනයෙන් කෙරෙන්නේ කොටි දේශපාලන නායකයෙකු වන පුලි තේවන් කී ලෙස කොටින්ගේ නිල නොවන හමුදා, පොලිස්, උසාවි, බැංකු, විද්‍යුත් මාධ්‍ය හා පරිපාලනය නීත්‍යානුකූල වීමය.

2001 - 09 - 11 නිව්යෝර්ක් ප්‍රහාර වලින් පසු ලෝකයේ ඇතිවූ ත්‍රස්ත විරෝධී මතය තුළ මෙය කොටින්ට කදිම ගැලවීමේ මගකි. විශේෂයෙන් 2004 වසරේදී පැවැත්වෙන ඉන්දියානු මහමැතිවරණයේදී සෝනියා ගාන්ධි හෝ කොටි විරෝධී සන්ධානයක් බලයට පත්වීමෙන් ඇතිවන තත්වයට මුහුණදීමටද කොටින්ට අවශ්‍ය නීත්‍යානුකූල ගැලවීම අන්තර් පාලනය තුල හෝ වෙනත් එවැනි පාලනයක රැඳී තිබේ. එංගලන්තයේ පළවන ජාත්‍යන්තර සගරාවක් වන "The London Economist" (20-07-02) සගරාවට අනුව අඩුම තරමින් ඩොලර් බිලියන 4 ක කොටින්ගේ වත්කම් කැනඩාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍යය හා එක්සත්ජනපදය කොටි තහනම් කිරීම නිසා ඔවුනට අහිමි වී ඇත. එය 2003 වසර සඳහා ලංකා ආණ්ඩුවේ මුළු ආදායම වූ බිලියන 3 ටද වඩා මුදලකි. ලංකාවේ මුළු විදේශ වත්කමවූ ඩොලර් බිලියන 2.23 ටද වඩා වැඩි මුදලකි. පසුගිය සත් වසර තුල (1995 -2002) ලංකා ආණ්ඩුව ආරක්ෂාව සඳහා වැයකළ මුළු මුදලටද වඩා වැඩි අගයකි . කොටින්ම මෙතෙක් ලංකාවේ මුළු විදේශ ණය ප්‍රමාණයද ඩොලර් බිලියන 5.4ක් වීමෙන් පෙනීයන්නේ ලංකා ආණ්ඩුවටත් වඩා කොටි පොහොසත් බවයි! තවද එකී සගරාව පෙන්නා දෙන්නේ කොටින්ගේ වැයම තම තහනම ඉවත් කරවාගෙන මේ මහත් ධනස්කන්දය නිදහස් කර ගැනීම බවයි. එමෙන්ම ජාත්‍යන්තර නීතියට හසුනොවූ කොටින්ගේ කෝටි දහස් ගණනක අරමුදල් ( උදාහරණ ගැලියන් අරමුදල - රාජරත්නම් හා ඥාණකෝන් ) ලංකාවේ ආයෝජනය වෙමින්ද ඇත. ලබන ජූලිමස බ්‍රිතාන්‍යය කොටි තහනම ඉවත්කරන බැව් කියැවේ. කැනඩාව හා ඕස්ට්‍රේලියාවද ඒ අනුව යනු ඇත.

රැලගට එවැනි අන්තර් පාලනයක් සිංහල ජනයාට කෙසේ බලපාඅිද යන්නය. අනිවාර්යයෙන්ම සිංහලයින් පමණක් නොව මුස්ලිම්වරුන්ද, කොටි නොවන දෙමළ සංවිධානද දෙමළ නාසිවාදී කොටින්ගේ මර්දනයට හසුවනු ඇත. උතුරු හා නැගෙනහිර ජීවත්වන ලක්ෂ තුනහමාරකට අධික සිංහලයින්ගේ ජීවිත විශේෂයෙන් අනතුරේ වැටෙනු ඇත. එපමණක් නොව උතුරු හා නැගෙනහිර සිංහලයින්ගේ පූජනීය සිද්ධස්ථාන, නගර ගම්බිම් හා ඉඩම් ඔවුනට අහිමිවීම ක්‍රමයෙන් සිදුවනු ඇත. කොටින්ම දියවඩන නිලමේ පත් කිරීමේ අයිතියත් මෙමගින් කොටි සංවිධානයට ලැබෙනු ඇත! මේ දෙමළ නාසිවාදී ආධිපත්‍යයේ ප්‍රතිඵලයක් ලෙස සන්නද්ධ නැගිටීමකට අරඅදිමින් සිටින මුස්ලිම් මූලධර්ම වාදයට සාමාන්‍ය මුස්ලිම් ජනයා පෙළගස්වා ගැනීමට නිමිත්තක් ලැබේ. එමගින් මුස්ලිම් මෙන්ම වෙනත් අරාජකවාදීන්ට රට ලේ විලක් කිරීමට අවකාශ ලැබෙනු ඇත. දෙමළ ප්‍රහාකරන් කෙනෙකු වෙනුවට මුස්ලිම් හා වෙනත් ප්‍රහාකරන්ලාද බිහිවනු ඇත. ඔසාමා බින්ලාදන් හා ඔහුගේ සෙනෙවි මොහොමද් අතිප් නැගෙනහිර හිසඔසවනු ඇත.

එවැනි අන්තර් පාලනයකින් වන රැලග දෙය නම් උතුරු හා නැගෙනහිර පරිපාලන තනි බස බවට දෙමළ පත් වීමයි. පසුගිය මාස කිහිපය තුළම එවැන්නකට උත්සාහ දැරීම් තිබිණි. ඒ හා සමග ඒ ප්‍රදේශ දෙමළ පරිපාලනයකට යටත්වේ. එයින් සිදු වන්නේ සිංහලයින්ට ඒ ප්‍රදේශ වලින් ඉබේම පිටවීමට සිදුවීමය.

එවැනි පරිපාලනයකින් වියහැකි රැලග දෙය නම් රජයේ ඉඩම්වල දෙමළ ජනපද බිහි කිරීමය. ඒ ප්‍රදේශවල බොහෝ සිංහලයින්ට ඇත්තේ ස්වර්ණභූමි ඔප්පු වන අතර කොටින්ගේ අන්තර්පාලනයට එකී සිංහල ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය අහෝසි කිරීමට ඉඩකඩ ලැබේ. පලස්තීනයේ යුදෙව් ජනපද බිහිවූවාසේ ලංකාව තුළින් පමණක් නොව තමිල්නාඩුව හා ලොව පුරාම දෙමළ ජනයා ගෙනවිත් මහා පරිමාණයෙන් දෙමළ ජනපද බිහිකිරීම ඇරඹෙනු ඇත.

අවසාන වශයෙන් උතුරු හා නැගෙනහිරින් ශ්‍රී ලංකා හමුද ඉවත් කිරීම සිදුවෙනු ඇත. අන්තර්කාලීන පියවරක් ලෙස විදේශ සාම සාධක හමුද ගොඩබෑස්සවීමේ සැලැස්මක්ද ඇත. මෙය ඉන්දුනීසියාවෙන් වෙන්වීයෑමේදී නැගෙනහිර ටිමෝරයට ඔස්ට්‍රේලියානු හමුද ගොඩබැස්සවීම වැනි ක්‍රියාවකි. ඒ සඳහා පෙරහුරුවක් ලෙස දැනටමත් බ්‍රිතාන්‍යයෙන් සාම සාධක හමුද නිලධාරීන් පැමිණ ශ්‍රී ලංකා හමුදවලට දේශන පවත්මින් සිටිති.

කෙසේවෙතත් තාඩිලන්ත දෙවන සාකච්ඡා වටයේදී අන්තර් පාලනය පිළිබඳ අදහස කොටි ඉවත දැම්මෝය. දැන් ඔවුන් කියන්නේ දැනටම උතුරු නැගෙනහිර ඔවුන්ගේ පාලනයක් තිබෙන බවය.

## උතුරේ සිංහලයෝ:

බොහෝදෙනා අමතක කරන්නේ උතුරේද සිංහලයින් ජීවත් වූ බවය. 1971 දී යාපනයේ සිංහල ජනගහණය 20,402 (3%) ක් විය. 1977, 78, 81 හා 1983 ජාතිවාදී කෝලාහල වලින් එහි විසූ සිංහලයෝ පලවාහරිනු ලැබූහ. 1981 දී යාපනයේ සිංහල ජනගහණය 4615 ක්වූ අතර 1987 ඔක්තොම්බර් 06 දකින් පසු එහි කිසිදු සිංහලයෙක් දැන් වාසය නොකරයි. 1981 දී මන්නාරමේ සිංහලයින් 8700 (8.2%) ක් වාසය කළ අතර 2001 ජුනි සංගණන අනුව දැන් එය 282 ක් පමණි! 1981 දී වවුනියාවේ සිංහලයින් 15,876 (16.6%) ක් වාසය කළ අතර 2001 ජුනි සංගණන අනුව දැන් එය 12,159 කි. ඔවුන්ගෙන් 10843 ක් ජීවත් වන්නේ වවුනියාව දකුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළය. එහි ඔවුනගේ ප්‍රතිශතය 98.7% කි. ඔවුනට අයත් භූමි ප්‍රමාණය වර්ග කි.මී. 188.5 කි! 1981 දී මුලතිව් දිස්ත්‍රික්කයේ සිංහල ජනගහණය 3948 ක්වූ අතර (6%) 2001 ජුනි වන විට එහි සිංහලයින් කිසිවෙක් ඉතුරුවී නොසිටියහ. 1999 නොවැම්බර් 01 ද මුලතිව් වලට අයත් ගජබාපුර, කලනිපුර ආදී ගම්මාන කොටි ත්‍රස්තවාදීන් විසින් අල්ලා ගන්නා ලදී. දෙමළ සංහාර ගැන කතා කරන බොහෝ දෙනා උතුරේ සිංහලයින්ට කළ මේ ජාතික අතුගෑදැමීම අමතක කිරීම ශ්‍රී ලංකාවේ අද ඇති ලොකුම ඛේදවාචකයයි.

ඊනියා අන්තර්පාලනය හෝ සන්ධිය පෙඩරල් විසඳුමකින් මුලින්ම බැටකන්නේ උතුරේ සිංහලයෝය. වවුනියා දකුණු මඩුකන්දේ සිට වැලිඔය නිම්නයේ මහවැලි එල් කලාපයේ සිංහලයෝ මුලින්ම අතුගෑදැම්මට ඉඩ ඇති ජනකණ්ඩායමය. කොටි ත්‍රස්තවාදයට දකුණට කඩාවැදීමට ඉඩනොදී ජීවිත පරිත්‍යාගයෙන් මිනිස් පවුරක් ලෙස සිටි ඒ වීරෝධාර මිනිසුන් 1999 නොවැම්බර් මස කොටි කාලතුවක්කු වලින් උපන්බිමේ අනාථයින් කරන ලදහ. දැන් අවසාන පාවාදීමට සූදනම් කරමින් සිටිති. දකුණේ වෙළඳ ලාභ ගැන සිතන ආත්මාර්ථකාමීන් සිතන්නේ උතුරේ සිංහලයින් බිලිදී තමන්ට නිදහසේ දකුණේ බිස්නස් කිරීමට කොටි ඉඩදෙනු ඇති බවය. නමුත් පලස්තීනුවන්ට සිය රට අහිමිවූවා සේ අනාගත මහා දෙමළ ඊළම හෝ ද්‍රවිඩස්ථානයට කොළඹත් නුවරත් මුළු රටත් ගොදුරුවනු ඇත. උතුරේ සිංහලයන්ගේ ඉතුරු බිතුරු හෝ අද නොරැක්කොත් හෙට දකුණේ සිංහලයින්ට පිහිටවනු ඇත්තේ මහමුහුද පමණි.

## අවුලට විසඳුම සිංහල සමගිය

කොටි සංවිධානයේ උපායවලිය දැන් ඉතා පැහැදිලිය. දකුණ හැකිතාක් අස්ථාවර කරමින් තබාගන්නා අතර උතුර හා නැගෙනහිර තමන් තනිව ශක්තිමත් වීම එහි දේශපාලන මූලෝපායයි. අවසාන විසඳුමක් ලෙස වෙනම රටක් තැනීමේ ස්වයං නිර්ණය අයිතියට යටත්වූ සහසන්ධිය රාජ්‍යයක් ඔවුන් ඉදිරිපත් කරනු ඇත. සහසන්ධිය රාජ්‍යයක් යනු ව්‍යවස්ථා දෙකක්, පාර්ලිමේන්තු දෙකක්, හමුද දෙකක්, පාලන ක්‍රම දෙකක් සහිත නමුත් දේශපාලන හෝ වෙනත් අවශ්‍යතා සඳහා එකට සිටින රාජ්‍යයන් දෙකක සන්ධානයකි. (මෙවැන්නක් අවසානයට අත්හද බලනු ලැබුයේ සර්බියාව, බොස්නියාව හා කෝම්කාව එක්ව තැබීමට ගිය යුගොස්ලාවියාවේය. එය රාජ්‍යය කැබලි වීමෙන් අවසන් විය) එතෙක් ඔවුන් ශ්‍රී ලංකා රාජ්‍යය උරා බොමින් තම යුදමය, ආර්ථිකමය හා දේශපාලනමය ශක්තිය වැඩිදියුණු කරගනු ඇත.

ඇතැම්විට දිගින් දිගටම දෙමළ-මුස්ලිම්, දෙමළ-සිංහල, සිංහල-මුස්ලිම් ආදී ගැටුම් උතුරේත්, නැගෙනහිරත්, කඳුකරයේත්, කොළඹත් ඇති කරගනිමින් රට තව තවත් දුර්වල කරනු ඇත. එයට සමාන්තරව ඔවුන් ඉන්දියාවේ දේශපාලනයද දුර්වල කරනු ඇත. ඔවුනගේ අරමුණ 1948 දී යුදෙව්වන් පලස්තීනය තුළ වෙනම යුදෙව් රාජ්‍යයක් ඊශ්‍රායලය නමින් ගොඩනැගූ ලෙස ජාත්‍යන්තර පිළිගැනීමක් සහිතවම තමන්ගේ රාජ්‍යයක් ස්ථාපිත කර ගැනීමය. යුදෙව්වන්ට නම් පලස්තීනයේ අයිතියක් වසර දහස් ගණනක සිට තිබිණි. නමුත් මවාගත් අයිතියක් මිස දෙමළ ජනයාට එවැනි ඓතිහාසික අයිතියක් නැගෙනහිර හෝ උතුරේ නැත. අනෙක් අතින් ඊශ්‍රායලය පසුව මෙනචම් බෙගින්ගේ (1931 දී ඉදිරිපත් කළ) මහා ඊශ්‍රායල දැක්මට අනුව මුළු පලස්තීනයත්, අවට රටවලුත් ගිලගත්තා සේ දෙමළ ඊළම, පෙරිය (මහා) දෙමළ ඊලම වී අන්තිමේදී ඉන්දියාවද දෙකඩ කරන ද්‍රවිඩස්ථානය වනු ඇත.

මෙතැනදී ඇතමුන් සිතන්නේ බටහිර රටවල් අපට උපකාර කරාවි කියාය. ඇත්තෙන්ම දිගටම, විශේෂයෙන් 1987 ඉන්දීය මැදිහත් වීමෙන් පසු කොටි සංවිධානය වර්ධනය කළේ බටහිර ජාතින්ය. ඔවුනට අද අවශ්‍ය කොටින් ත්‍රස්තවාදීන්ගේ සිට නීත්‍යනුකූල බලවේගයක් බවට පත්කරවීම මිස කොටි ත්‍රස්තවාදය විනාශ කිරීම නොවේ. නැගෙනහිර ආසියාවේ ආර්ථික බලයට හා දේශපාලන බලයට බියවී සිටින බටහිර ලෝකය දකුණු ආසියාවේ දෙමළ ඊශ්‍රායලය ගොඩනංවමින් සිටිති. ඔවුන් නැගෙනහිර ආසියාවේ ක්‍රිස්තියානි ඊශ්‍රායලය ටිමෝරය නමින් ගුස්මාවෝ ගේ නායකත්වයෙන් (1999) ගොඩනැංවූ බව අප අමතක නොකළයුතුය. මේ නිසා බටහිර ලෝකයෙන් ලංකාව දෙකඩවීම වැලැක්වීමට උපකාර ඉල්ලීම හොරාගේ අම්මාගෙන් පේන ඇසීමකි.

අනෙක් අතින් සාමාන්‍ය මුස්ලිම් ජනයා කොටින්ගේ ම්ලේච්ඡ ක්‍රියාවලින් පීඩාවට පත්වී ඔවුනට ආරක්ෂක ප්‍රශ්නයක් පැනනැග ඇත. එයට විසඳුම සිංහල-මුස්ලිම් සියළුදෙනා එක්වී උතුරින් නැගෙනහිර වෙන්කිරීමේ ව්‍යාපාරයකට යෑමය. නමුත් එතැනදී බොරළියේ මාළු බෑමට තැත් කරන ඉස්ලාම් මූලධර්මවාදීන් විශේෂයෙන් අල්කයිදවට සම්බන්ධ බලවේගවලින් ප්‍රවේශම් විය යුතුය. අල්කයිදව පසුගිය දශකය තුළ එරිත්‍රියාව, බොස්නියාව, එක්සත් යේමනය ආදී රාජ්‍යයන් ගණනාවක් අලුතින් බිහි කළෝය. එක්සත් ජනපදය, රුසියාව, චීනය, ඉන්දියාව සමග එකවර සටන් කරන අල්කයිදාවට නවාතැනය වෙනුවෙන් ලංකාවේ යුද වැදීම කප්පක් නොවේ. මේ නිසා දෙමළ අන්තවාදයට එරෙහිව දෙමළ බලවේග සමගත් මුස්ලිම් අන්තවාදයට එරෙහිව මුස්ලිම් බලවේග සමගත් එකට කටයුතු කිරීමට සිංහලයින්ට

රූපය - අංක 01

# යෝජිත දෙමළ ඊළම


(1977 දෙ.එ.වි.පෙ. මැතිවරණ ප්‍රකාශය)



## රූපය - අංක 02

# 1981 ජන ගහණ සංඛ්‍යා ලේඛන අනුව ලංකා දෙමළ ජන ව්‍යාප්තිය

(දෙමළ ඊළම සමග සසඳන්න)



රූපය - අංක 03


# නිශ්ශංක මල්ල යුගයේ සිංහල පළාත් බෙදීම
# 12 වන සියවස ත්‍රිසිංහලය



රූපය - අංක 04


ලන්දේසි ප්‍රදේශ(ආසන්නයෙන්)

උතුරට නැගෙනහිර ප්‍රදේශ එක්කරන්නේ ලන්දේසින්ය



රූපය - අංක 05

# මුල්ම ඉංග්‍රීසි පළාත් බෙදීම හා උඩරට රාජධානිය කැබැලි කිරීම



රූපය අංක 06

## කුච්චවේලි ශිලා ලිපිය (ක්‍රි.ව. 6 වැනි සියවස) - ත්‍රිකුණාමලය

පෙළ

අනෙන දුංබං වනපනිය සර්වම්
පුණේ‍යන ලොකසස සුඛම් සමග්‍රම්
දතුං ප්‍රහුර් ජන්මනි ජන්මනි සහම්
සද ක්ෂාමාවි කරුණාන්විතෝ හම්
පුණේ‍යයන මාර දෙශ රිපුනනෙන
ජත්වා විරාම් ස්මධි ගමස ජිනේන්ද්‍රනාං තාම්
සංසාර පංක විසරාද සමුද්ධරෙය
මාර්ත්තං ජගන්මම මහා කරුණා කරෙණ

අරුත

මේ පිනින් උපනුපන් ජාතියෙහි ලෝකයාගේ සියළු දුක් බැහැර කොට පූර්ණ සැප ලබාදෙන්නට මට හැකිවේවා ! සියළු කල්හි ඉවසීමෙන් හා කරුණාවෙන් යුක්ත වූයේ වෙම්වා!

මේ පිනින් මර සතුරු පරදවා ශ්‍රේෂ්ඨ වූ ඒ බුදුබව ලැබ, මම මගේ මහා කරුණා නැමැති හස්තයෙන් දුකට පත් ලෝකයා සංසාර නැමැති මඩ වගුරෙන් ගොඩට ගනිම්වා!

## පියංගල - අම්පාර (සමහරක්)

පෙළ

දෙවනපිය මහරජහ ගමණි අබහ ජිත පරුමක දුත
ශුමන ජය අඩිතිෂය ලග්ක ලෙණ

අරුත

දේවානම්පිය මහරජුගේ ගමණි අබාගේ (දුටුගැමුණුගේ) දියණිය නානාපති ශුමන පුමුඛයාගේ බිරින්දගේ විශිෂ්ඨ ලෙණයි.

පෙළ

පරුමක බිත පුත පරුමක දුක ශුමනහ ලෙණෙ
අගත අනගත චතුද්ශ ශගශ පතිටපිතෙ

අරුත

මින්න පුමුඛයාගේ පුත්‍ර නානාපති ශුමන පුමුඛයාගේ ලෙණ පැමිණ නොපැමිණි සතර දිග සංඝයාට ප්‍රතිෂ්ඨාපිතයි.

## සමන්ගල - අම්පාර (සමහරක්)

පෙළ

තිශ තෙරශ ශුදශනෙ
බත(අ) මරශ
බත චුඩතිශහ අචරිය දතහ ලෙණ

අරුත

තිශ්‍ය තෙරුන්වහන්සේගේ සුදර්ශණ ලෙණ පුදන ලදී.
ස්වාමි මරගේ ලෙණ පුදන ලදී.
ස්වාමි චූලතිෂ්‍යගේ ආචාර්ය වූ දත්තගේ ලෙණ පුදන ලදී

---

රූපය අංක 07

## සිංහල බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථානවලිය.

## නැගෙනහිර පළාත

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

01. කන්තලේ වාන්ඇල නම් ස්ථානයේ දාගැබක සහ වෙනත් නෂ්ටාවශේෂ ඇත. මේ ස්ථානයට පන්සල් වත්ත කියාත් "මණි අරසන්කුලම්"කියාත් කියති.
02. කිලිවෙඩ්ඩි දෙහිවත්ත ගම්සභා කර්යාලයට නුදුරින් පිහිටි රජ්යේ කැලෑවේ පැරණි දාගැබක් ඇත.
03. බටහිර කට්ටකුලම් පත්තුවේ මොරවැව ජනපදයේ සිරි ගජබාලෙන් විහාරස්ථානය.
04. ශ්‍රී අග්බෝපුර රජ මහා විහාරය.
05. තිරියාය
06. ගෝකර්ණ විහාරය (කෝනේෂ්වරම් කෝවිල)
07. මැදවච්චිය ශ්‍රී රජ මහා විහාරය, බටහිර කට්ටකුලම් පත්තුව.
08. කුච්චවේලිය
09. ලංකා පටුන (ඉලංකෙතුරෙයි)
10. කුච්චවේලියේ ඌරාකාට ළිඳ
11. සෙම්බිමලේ
12. නල්ලම්පත්තුව හන්දිය අසල ගල් කොරිය ඉදිරිපිට කැලයේ ගල් කණු 20 ක් මධ්‍යයේ ඇති බුදු පිළිමය

13. තිරියාය මාර්ගයේ කැලයේ අඩි 18 ක් පමණ උස් දගැබක් ඇත.
14. කුච්චවේලි පොලිස් වසමේ ජෝන් මාමා යන අයගේ හේනට නුදුරින් පැරණි පොකුණක් සහ දගැබක් ද ඇත.
15. සැ. 5 කණුව අසල දගැබ් දෙකක්, මල් ආසන හා වෙනත් නටබුන් ඇත.
16. කුච්චවේලි ප්‍රදේශයේ ආලන්කුලම අසල දගැබ් අවශේෂ ඇත.
17. වෙල්ගම වෙහෙර
18. සේරුවිල
19. සෝමපුර දක්ෂිණාරාමය
20. මොරවැව ටිරුකේටි 6 කොටසේ බුදු පිළිමයක් සහ වෙනත් පුරා වස්තු ඇත.
21. සෝමපුර පශ්චිමාරාමය
22. රන්ගිරි උල්පත
23. පුලියන්ඩිකුලම
24. පූර්වාරාමය, ගෝමරන්කඩවල
25. වෙහෙරබැඳිකන්ද, කිඹුල්මැටියාව
26. කින්නගමේ අලන්කර්නිගි කටායුනඩි නම් ස්තානයේ මධ්‍ය අනුරාධපුර යුගයේ බෞද්ධ නටබුන් ඇත.
27. අල්ල කන්තලේ පාරේ 16 වන හා 14 වන කණුවලට නුදුරින් දගැබ් දෙකකද, වැඩ හිඳිනා බුදු පිළිමයකද ඇත.
28. මුතුර්හි මහවැලි ගඟ උතුරේ කැලයේ නටබුන් රාශියක් ඇත.
29. රිදී කන්ද (කන්දමාලාව)
30. මාන්කුලම් ඔඩ්ඩිසුඩ්ඩාන් පුනුකුඩුයිරුප්පු පාරේ 75 වැනි සැතපුම් කණුව අසළ බුදු පිළිමයක් හා නටබුන් ඇත.
31. කිලිවෙඩ්ඩි බෝධිය පිහිටි ස්ථානය
32. ගල්මැටියාව වැව අසල බුදු පිළිමයක් හා ගල්කණු ඇත.
33. පරම්පන්ජක වැව අසල පැරණි දගැබක හා ගොඩනැගිලිවල නටබුන් ඇත.
34. තින් ගඟ ව්‍යාපාරයේ සිට සැ.21/2 ක් පමණ කැලයේ ඇති ගල් පාලම අසල පැරණි දගැබක් සහ පුරාවස්තු ඇත.
35. මුතුර් ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ 59 වැනි සැතපුම් කණුව අසළ පැරණි දගැබ පිහිටි ස්ථානය
36. පඩ්ඩිනිමුල්හි ගල් කණු, කොරවක් ගල් ආදී නටබුන් පිහිටි තැන.
37. යාම්පූර් ග්‍රාමයේ නෙළුම් මල් පෙති කොටා ඇති මල් ආසනය ආදී නටබුන් ඇති ස්ථානය.
38. සේරුවිල ප්‍ර.ආ.නි. කොටසේ පන්සල් ගොඩනැගිල්ල නැමැති ස්ථානය
39. මන්ඩල ගිරි විහාරය - බුදු පිළිමයක්, යන්ත්‍ර ගලක්, දගැබක්, සෙල්ලිපියක් ඇති ස්ථානය.
40. ආරාම කන්ද - පැරණි දගැබක්, පොකුණක් හා සෙල්ලිපි
41. කන්තලේ දුම්කොළ වගාවේ පිහිටි දගැබ්
42. කොම්බනච් (උතුරු කොටස)
43. පොරමඩු
44. කොට්ටන්ඩොලේ
45. කල්ලාර් පාරේ කඩු මැදුරට උතුරින් පිහිටි පුරා වස්තු
46. පවනේ
47. ත්‍රිකුණාමලය - මඩකලපු මාර්ගයේ 58, 59 සැතපුම් කණු අසළ වෙහෙර දෙකක නටබුන්
48. ත්‍රිකුණාමලයේ සිට සැ. 05 ක් පමණ දුරින් පිහිටි ආන්දම්කුලම්
49. ගල්මැටියාව - කොළඹ - ත්‍රිකුණාමලය පාරේ
50. සුනෙත්‍රා වැව නටබුන්
51. කන්තලේ පැට්රෝල් ගබඩාව ඉදිරිපිට කඳු ගැටයෙහි ඇති පැරණි දගැබ් අවශේෂ
52. කන්තලේ සීනි සංයුක්ත මණ්ඩල භූමියෙහි පුරා වස්තු - බුදු පිළිමාදී
53. පුල්මුඩේ අරමඩලේ ප්‍රදේශය
54. අල්ලේ ජනපදයේ පල්ලේවෙල
55. වෙළුවන්න රජ මහා විහාරය
56. ත්‍රිකුනාමලය - කන්තලේ පාරේ සැ.6 ක් පමණ ගොස් 153/11 බෝක්කුව පසු කළ වහාම කුඹුරේ ඇති දගැබ
57. රජ මහා විහාරය රජ ඇල
58. ත්‍රිකුනාමලය - කන්තලේ පාරේ කි.මී. 246 කණුවේ අසළඇති තෝක්ක වත්තේ දගැබක නටබුන් ඇත.
59. කන්තලේ ප්‍රධාන මාර්ගයට පැමිණ මද දුරක් ගොස් දකුණට හැරී බඹ 16 ක් පමණ දුම්රිය මාර්ගයේ අසළ දගැබ
60. ත්‍රිකුනාමලය දෙසට එන විට ප්‍රදන මාර්ගයේ 153/13 දරණ බෝක්කුව අසලින් වමට හැරී සැතපුමක් ගුරු පාරේ ගිය විට දගැබක් ඇත. මෙහි සෙල්ලිපිය කෞතුකාගාරයට භාරදී ඇත.
61. කුච්චවේලි නගරය පසු කර තිරියාය දෙසට සැතපුම් 6 ක් පමණ දුර ගිය පසු දක්නට තිබූ බුදු පිළිමය
62. ගල් මඩුව, කුච්චවේලි - ගෝමරන්කඩවල පාරේ 4/1 බෝක්කුව ළඟින් වමට හැරී අමුණ පාරේ සැ.03 ක් ගිය විට.
63. කෝවිල් ගොඩැල්ල, නීලපොලගම.
64. කගවේලිගම, දෙහිවත්ත.
65. තිරියායේ ගිරිහඬු සෑයට සැ.02 ක්දුරින් බස්නාහිර පැත්තට යාන් ඔය අසල වන මැද දගැබක්, නටබුන්, වටදගෙයක්
66. කුඹුක් වැව, මොරවැව
67. ත්‍රිකුණාමලය - අනුරාධපුර පාරේ 10 වැනි සැතපුම් කණුව අසල මරංචාඩිය පාරේ දගැබ් දෙකක් හා නටබුන්
68. කල්ලම්පත්තුවේ 17 වැනි සැතපුම් කණුව ආසන්නව පැරණි ගල් කනු සහිත නටබුන් ස්තානයක්
69. එම ස්ථානයට යාබදව හේනක බුදු පිළිමයක් සහිත පැරණි විහාර නටබුන්
70. කොට්ටුකුලම් පස්නාර් පොලිසියේ සිට සැ.08 ක් පමණ දුරින් කැලයේ දගැබක්, බුදු පිළිමයක් සහිත නටබුන්
71. මාරියකුලම
72. තොප්පූර්
73. ත්‍රිකුණාමලය - අනුරාධපුර පාරේ බටහිර කුඹුක් වැව සන්දියෙන් වමට හැරී ගිය විට පන්සල්
74. බටහිර කුඹුක් වැව හඹරාවැවගම පටන්ගන්නා ස්ථානය අසල ජලය ගලා බස්නා ඇල ආශ්‍රිත ඇති පුරාවස්තු
75. ත්‍රිකුණාමලය - අනුරාධපුර පාරේ බටහිර කුඹුක් වැව (දැනට මහා දිවුල් වැව) ව්‍යාපාරය අසල බුදුපිළිමය

76. වෙරු ගල් - බෞද්ධ ස්තූප ආදිය
77. තිරුමංගලාව
78. කිච්ලකඹවල පහළ නටබුන්
79. සේරුනුවර මංසන්ධියේ බෝ මළු විහාරය
80. වෙහෙරවැඳි කන්ද (හා ඇටියාව)
81. විල්ගම් වෙහෙර
82. කුලාවඩිකුලම්
83. නිලපන්නික්කම්කුලම් වැව අසල නටබුන්
84. මාන්දන්කුලම් අසල නටබුන්
85 මඩුවන්කුලම්, කුට්ටවේලි
86. මඩිලවැව පාසල අසල දාගැබ
87. නයාගල
88. විල්පනාකුලම් (2 වන කණුව අසල)
89. මෛත්‍රී වැව පාරේ නටබුන්
90. නාමල් වත්ත විහාරය
91 මොරවැව වනාප්ති කොළනිය
92 බාවාමලේ
93 වාන්ඇල ජනපද සීමාවේ අබ්දුල් සකාර් නැමැති අයගේ අනවසර ඉඩමේ
94 බටහිර හබලගමුවේ සේන වල්ලි වැව
95. } කන්තලේ මහවැලි සංවර්ධන මණ්ඩලයට අයත් ප්‍රදේශයේස්ථාන තුනක්
96.
97.
98. මහා දිවුල් වැව නටබුන්
99. හැළඹ වැව
100. මැදවච්චිය ග්‍රා.සේ.නි. වසම තුළ මැදවච්චිය ගාව ආසන්නයේ ඇති බුදු පිළිම සහිත පුරා වස්තු
101. එළන්දකුලම් - කුච්චවේලි අසල

## මඩකලපු දිස්ත්‍රික්කය


01. නෙළුගල
02. පොතුවිල්
03. එත්තම
04. ජයරම්පොල
05. රංගම
06. සංගම කන්ද
07. කිරිමුත්තිපාල විහාරය
08. කොටවෙහෙර
09. කිරලාගල
10. රොට්ටේයි විහාරය
11. ලංකා විහාරය
12. කිණ්ණරගල
13. හුළනුගේ
14. බඹරගස්තලාව
15. තාන්තොන් ඊස්වරන් කෝවිල (කොක් කඩ්චොලෙය)
16 කෝපවාලි
17. මංගලඔය (මහ ඔය) (මාවඩිබ්‍රහ්මාර්ග්‍රාමම්)
18. කෝරලේපත්තු - පුනාහි කවුඩාගල (දම්විය මඩුකුලම් අසල) බෞද්ධ විහාරයකි.
19 පුල්ලුමලේ (මහඔය - අම්පාර පාරේ 29 වන කණු අසලින් සැ.4 ක් කැලැව)
20. අකරාණ් (වකනෙර් කොටස)
21. බැරුණ්ඩිකැප්
22. කරවකුකුලම්
23. දඹලියද්දේගල
24. මාඩඩිබේ
25. තියන්කල්ලුකුලම්
26. කිරිමැටි ආරු
27. පඩිඑන්නනමලේ

## අම්පාර දිස්ත්‍රික්කය

01. රජගල
02. දීඝවාපිය
03. පුළුකුනාව
04. සමන් ගල
05. කොට වෙහෙර
06. මගුල් මහා විහාරය
07. ලාහුගල
08. කුඩුම්බිගල
09. නිලගිරිසෑය
10. මුහුදුමහාවිහාරය
11. කඳුරුගොඩ
12. ශාස්ත්‍රවෙල විහාරය
13. ගොනාගොල්ල
14. මුල්ලිකුලම්මලෙයි
15. කනප්කුඹිආරු
16. මලයඩිකන්ද
17. ලාහුගල කොට වෙහෙර
18. පල්ලන්ඔය
19. වෙහෙරපුදම්
20. කොක්නගර ජනපදය
21. බුද්ධංගල
22. මුවංගල
23. ගනේගම විහාරය
24. බක්කිඇල
25. කිවුලේගම
26. වාච්චන
27. පහන්ගොඩ විහාරය
28. පරණ ගම - බක්කි ඇල


රූපය - අංක 08

## නැගෙනහිර පළාතේ දෙමළ ජනගහනය හා ඉඩම් අයිතිය (1981 - ජුනි)




රූපය - අංක 09

# ඉන්දියානු මුස්ලිම් ලීගයේ යෝජිත ඉස්ලාම් සහසන්ධිය රාජ්‍ය එකතුව





මුස්ලිම් රාජ්‍යයන්

රූපය - අංක 10



රූපය - අංක 11

## දෙමළ ජනාවාස නැගෙනහිර විසිරී ඇති ආකාරය
## (ඔවුන් කේන්ද්‍රගතවී ඇත්තේ ලන්දේසි 1766 බල ප්‍රදේශවලය)



රූපය - අංක 12

# සමූහ ඝාතන ලැයිස්තුව - නැගෙනහිර පළාත (සමහරක්)

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

| දිනය | ස්ථානය | සිදුවූ ආකාරය | සිදුවීමට බඳුන් වූ ස්ථානය | මියගිය සංඛ්‍යාව | තුවාල ලද |
|---|---|---|---|---|---|
| 1985. 5. 30 | මූතූර් | පහරදීම | මිහිඳුපුර ගම්මානය | 15 | 08 |
| 1985. 6. 11 | මූතූර් | පහරදීම | දෙහිවත්ත ගම්මානය | 13 | 11 |
| 1986. 4. 18 | මොරවැව | පහරදීම | | 7 | 00 |
| 1986. 6. 25 | සේරුනුවර | පුපුරුවාහැරීම | | 12 | 03 |
| 1986. 7. 17 | කන්තලේ | පහරදීම | සීනි සංස්ථාව | | |
| 1986. 7. 17 | තිරියාය හන්දිය | පුපුරුවා හැරීම | ජීප්රිය පුපුරුවා හැරීම | 06 | 00 |
| 1987. 4. 17 | ත්‍රිකුණාමලය | පහරදීම | හබරණ | 127 | 31 |
| 1987. 4. 20 | ත්‍රිකුණාමලය | පහරදීම | ජයන්තිපුර | 19 | 08 |
| 1987. 10. 10 | කන්තලේ | පහරදීම | ගන්තලාව | 19 | 06 |
| 1987. 10. 15 | ත්‍රිකුණාමලය | පහරදීම | කන්තලේ | 17 | 08 |
| 1987. 10. 16 | ත්‍රිකුණාමලය | පහරදීම | පල්ලිමොඩෙයගම | 11 | 00 |
| 1988. 3. 02 | මොරවැව | පහරදීම | ගම්මානවලට පහරදීම | 17 | 08 |
| 1988. 3. 5 | කන්තලේ | පුපුරුවා හැරීම | ලොරියක් පුපුරුවා හැරීම | 19 | 03 |
| 1988. 3. 14 | ගල්මැටියාව කන්තලේ | පහරදීම | එල්ටීටීඊ. පහරදුන් ගම්මාන | 18 | 03 |
| 1988. 3. 15 | මොරවැව | පහරදීම | එල්ටීටීඊ. ගම්මාන වලට පහරදීම | 11 | 07 |
| 1988. 5. 1 | කන්තලේ | පහරදීම | සීත්තාරුගම | 24 | 06 |
| 1988. 11. 04 | ගෝමරන්කඩවල | පහරදීම | පන්නිකැනියාය | 28 | 60 |
| 1990. 7. 25 | ත්‍රිකුනාමලය | පහරදීම | වනෙල් ගම්මානය | 11 | 08 |
| 1990. 7. 31 | ත්‍රිකුණාමලය | පහරදීම | පෝදන්කඩ ගම්මානය | 13 | 00 |
| 1990. 8. 13 | පුල්මුඩේයි | පහරදීම | බෝගස්වැව දී ලොරියට | 17 | 11 |
| 1990. 10. 02 | පදවිය | පහරදීම | වාහල්කඩ | 09 | 00 |
| 1991. 4. 3 | ත්‍රිකුණාමලය | පහරදීම | පෝල්පොයින්ට්, කෙවිලිය | 26 | 11 |
| 1991. 10. 24 | කුච්චවේලි | පහරදීම | වෑන් රියකට | 6 | 00 |
| 1992. 8. 30 | ත්‍රිකුණාමලය | පහරදීම | නගරයේදී | 15 | 34 |

| දිනය | ස්ථානය | සිදුවූ ආකාරය | සිදුවීමට බඳුන් වූ ස්ථානය | මියගිය සංඛ්‍යාව | තුවාල ලද |
|---|---|---|---|---|---|
| 1995. 5. 25 | ත්‍රිකුණාමලය | පහරදීම | කල්ලාරව ගම්මානය | 44 | 00 |
| 1995. 10. 21 | පදවිය | පහරදීම | ගල්හලාව | 21 | 00 |
| 1997. 07. 20 | ත්‍රිකුණාමලය | පුපුරුවා හැරීම | එ.ජා.ප. පා. මන්ත්‍රී | 06 | 11 |
| 1999. 5. 31 | පදවිය | පහරදීම | කිරිඉබ්බන් වැව | 06 | 11 |
| 2000. 1. 21 | මොරවැව | පහරදීම | රුස්විමකදී | 08 | 72 |
| 2000. 4. 12 | ත්‍රිකුණාමලය | පහරදීම | අළුත් අවුරුදු උත්සවයේදී | 11 | 92 |

## අම්පාර දිස්ත්‍රික්කය

| දිනය | ස්ථානය | සිදුවූ ආකාරය | සිදුවීමට බඳුන් වූ ස්ථානය | මියගිය සංඛ්‍යාව | තුවාල ලද |
|---|---|---|---|---|---|
| 1987. 02. 07 | අරන්තලාව | පහරදීම | ගම්මානවලට පහරදීම | 31 | 08 |
| 1987. 06. 02 | අරන්තාලාව | පහරදීම | බුද්ධ පුත්‍රයන් ඝාතනය | 35 | 04 |
| 1987. 10. 07 | අම්පාර | පහරදීම | පොතුවිල් | 29 | 04 |
| 1988. 3. 17 | දීඝවාපිය | පහරදීම | | 17 | 10 |
| 1988. 3. 31 | කල්මුනේ | පහරදීම | සෙයින්තිමදුරු ගම්මානය | 19 | 07 |
| 1988. 09. 10 | සෙන්ට්‍රල් කෑම්ප් | පහරදීම | 16 වන ජනපදය | 11 | 00 |
| 1989. 02. 02 | මහඔය | පහරදීම | බෝගමුයාය ගම්මානය | 14 | 00 |
| 1990. 07. 24 | අරලගන්විල | පහරදීම | අරලගන්විල ගම්මානය | 12 | 18 |
| 1990. 07. 30 | අක්කරපත්තුව | පහරදීම | | 14 | 00 |
| 1990. 08. 05 | අක්කරපත්තුව | පහරදීම | ගොවින්ට | 19 | 73 |
| 1990. 08. 06 | අම්පාර | පහරදීම | ගම්මාන වලට (6 වන) පහරදීම | 39 | 00 |
| 1990. 08. 07 | උහන | පහරදීම | බණ්ඩාරදෙව්ව ගම්මානය | 34 | 00 |
| 1990. 08. 12 | සමන්තුරේ | පහරදීම | මුස්ලිම් ගොවින්ට | 06 | 00 |
| 1990. 08. 13 | සමන්තුරේ | පහරදීම | 12 වන ජනපදයට | 06 | 00 |
| 1990. 09. 19 | අම්පාර | පහරදීම | උහන ගම්මානය | 09 | 02 |
| 1990. 11. 15 | අම්පාර | පහරදීම | 12 වන ජනපදයට | 06 | 00 |
| 1991. 01. 23 | අම්පාර | පහරදීම | බෝගමුයාය ගම්මානයට | 29 | 13 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1991. 04. 24 | අක්කරපත්තුව | පහරදීම | මාලු වෙළඳපලට | 09 | 32 |
| 1991. 05. 19 | දමන | පහරදීම | ධාවනය වන ට්‍රැක්ටරයකට | 06 | 00 |
| 1991. 05. 20 | අම්පාර | පහරදීම | මල්වත්ත | 09 | 02 |
| 1991. 06. 24 | අම්පාර | පහරදීම | ලාහුගල ගම්මානයට | 19 | 08 |
| 1991. 06. 27 | පොතුවිල් | ගිනිතැබීම | බසයට 21 වන සැහපුමේදී | 25 | 00 |
| 1991. 08. 08 | සමන්තුරේ | පහරදීම | මුස්ලිම් ගොවීන්ට | 06 | 00 |
| 1991. 09. 01 | කන්තන්කුඩි | පුපුරුවා හැරීම | වෑන් රියක් | 06 | 20 |
| 1991. 09. 18 | පල්ලියගොඩැල්ල | පහරදීම | මුස්ලිම් ගම්මානයට | 13 | 00 |
| 1992. 01. 26 | මහඔය | පුපුරුවා හැරීම | ලැන්ඩ්මයින් එක | 10 | 25 |
| 1992. 01. 26 | අම්පාර | පහරදීම | බොරපොල | 14 | 17 |
| 1992. 04. 10 | අම්පාර | පුපුරුවා හැරීම | බසයක් | 29 | 00 |
| 1992. 05. 16 | අම්පාර | පහරදීම | | 06 | 00 |
| 1992. 06. 02 | අක්කරපත්තුව | පහරදීම | ධාවනය වන බසයකට | 17 | 02 |
| 1992. 08. 20 | සෙන්ට්‍රල් කෑම්ප් | පහරදීම | | 06 | 00 |
| 1992. 10. 24 | අම්පාර | පහරදීම | නගරය | 25 | 33 |
| 1995. 10. 25 | අම්පාර | පහරදීම | පැනමා ගම්මානය | 14 | 00 |
| 1996. 09. 07 | අරන්තලාව | පහරදීම | සිංහල ගම්මාන වලට පහරදීම | 10 | 27 |
| 1999. 07. 05 | ඉගිනියාගල | පහරදීම | සාප්පුව කොල්ලකෑම | 06 | 00 |
| 1999. 07. 06 | අම්පාර | පහරදීම | ඉගිනියාගල | 07 | 36 |
| 1999. 09. 18 | අම්පාර | පහරදීම | ගෝනගල ගම්මානය | 46 | 05 |
| 1999. 9. 21 | අම්පාර | පහරදීම | පුඩුක්කුඩුර්ප්පු ගම්මානය | 15 | 11 |

## මඩකලපුව දිස්ත්‍රික්කය

| දිනය | ස්ථානය | සිදුවූ ආකාරය | සිදුවීමට බඳුන් වූ ස්ථානය | මියගිය සංඛ්‍යාව | තුවාල ලද |
|---|---|---|---|---|---|
| 1986 .09 18 | මඩකලපුව | පුපුරුවා හැරීම | කාර් බෝම්බයකි | 14 | 07 |
| 1986. 12 16 | මඩකලපුව | පහරදීම | | 06 | 00 |
| 1987 .10 .06 | එරාවූර් | පහරදීම | ලාවාගා ගම්මානය | 34 | 03 |
| 1987. 10. 06 | මඩකලපුව | පහරදීම | | 21 | 08 |
| 1990. 07. 11 | එරාවූර් | පහරදීම | කොට්ඨාශ 3 - 6 | 121 | 20 |
| 1991. 06. 07 | වැලිකන්ද | පහරදීම | ධීවරයන්ට | 09 | 00 |
| 1991. 06. 12 | මඩකැලපුව | පහරදීම | කොච්චිකඩේ | 11 | 00 |
| 1992. 03. 19 | මඩකලපුව | පුපුරුවා හැරීම | හෝටලයක් | 04 | 00 |
| 1992. 07. 15 | මඩකලපුව | පහරදීම | හිරියන්කුලම | 19 | 07 |
| 1992. 07. 21 | මඩකලපුව | පහරදීම | පරංගිය මඩු | 07 | 00 |
| 1995. 08. 08 | මඩකලපුව | පුපුරුවා හැරීම | වෙළදපොළ අසල | 06 | 11 |
| 1996. 02. 23 | වලච්චනෙයි | පුපුරුවා හැරීම | ළමුන් ඝාතනය | 06 | 00 |
| 1997. 12. 27 | මඩකලපුව | පහරදීම | EPRLF සාමාජිකයන් | 06 | 00 |
| 1998. 03. 09 | එරාවූර් | පුපුරුවා හැරීම | ට්‍රැක්ටරයක් | 06 | 00 |
| 1999. 07. 14 | මඩකලපුව | පුපුරුවා හැරීම | කාල බෝම්බයක් | 15 | 00 |
| 2000. 05. 14 | මඩකලපුව | බෝම්බ ප්‍රහාරය | වෙසක් දින | 22 | 82 |

රූපය - අංක 13

# සමස්ත අනාථයින් උතුරු හා නැගෙනහිර දෙපළාත

| දිස්ත්‍රික්කය | සිංහල ජන ගහණය හා සංගණන වසර | අපේක්ෂිත ජන ගහණය 2001 | සත්‍ය ජන ගහණය 2001 | සැබෑ අනාථයින් ගණන |
|---|---|---|---|---|
| යාපනය | 20.402 (3%) (1971) | 36.519 | කිසිවක් නැත | 36.519 |
| මන්නාරම | 8700 (8.14%) (1981) | 13.050 | 48 | 13.002 |
| වවුනියා | 15.876 (16.5%) (1981) | 23.814 | 12.159 | 11.655 |
| මුලතිවු | 3948 (6%) (1981) | 5422 | කිසිවක් නැත | 5922 |
| | | | එකතුව | 67.098 |

| දිස්ත්‍රික්කය | සිංහල ජන ගහණය | අපේක්ෂිත ජන ගහණය 2001 | සත්‍ය ජන ගහණය 2001 | සැබෑ අනාථයින් ගණන |
|---|---|---|---|---|
| මඩකලපුව | 11.281 (4.4%) (1971) | 20.192 | 2289 | 17.903 |
| ත්‍රිකුණාමලය | 98.431 (4.4%) (1981) | 1.46.259 | 77.812 | 68.447 |
| | | | එකතුව | 86.350 |

අපේක්ෂා කරන ජන ගහණය සෙවීමේදී මේ ප්‍රදේශවල ජන ගහණ වර්ධන වේගය ලෙස 2% උපරිම අගය සැලකිල්ලට ගෙන ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ අනාථයින් සඳහා එය යොදා ගත නොහැකි වන්නේ 1981 න් පසුව මහවැලි බිම් වල පදිංචියට පිරිස් පැමිණ ඇති නිසාය. කෙසේ වෙතත් අම්පාර, අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල අනාථයින් ප්‍රමාණය 12.000 ක් පමණ වේ. එවිට මුළු සිංහල අනාථයින් ප්‍රමාණය 1.65.448 ක් වේ

## රූපය - අංක 14
# ඉඩම් අයිතිය

අම්පාර - වර්ගප්‍රමාණය 4415 ව.කි.මී. 2001 ජූනි

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සිංහල ජන ගහණය හා ප්‍රතිශතය | භූමි ප්‍රමාණය |
|---|---|---|
| දෙහිඅත්තකණ්ඩිය | 61.840 (98.8%) | 400.2 |
| පදියතලාව | 15.539 (99.3%) | 348.6 |
| මහඔය | 17.426 (99.5%) | 676.6 |
| උහන | 52.059 (99.8%) | 424.4 |
| දමන | 34.497 (99.3%) | 538.8 |
| අම්පාර | 37.251 (98.0%) | 149.4 |
| ලාහුගල | 6910 (91.0%) | 818.4 |

මුළු ඉඩම් ප්‍රමාණයෙන් 77% කි 3406.4

1981 අනුව 3391.1 (ජලාශ හැර) වැව්ගම්පත්තුව උතුර - දකුණ, බින්තැන්න පත්තු උතුරු - දකුණ, පානම පත්තුව යන ප්‍රදේශ සිංහල ප්‍රදේශ විය.

ත්‍රිකුණාමලය - මුළු භූමි ප්‍රමාණය 2727 ව.කි.මී. 2001 ජූනි


| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සිංහල ජන ගහණය හා ප්‍රතිශතය | භූමි ප්‍රමාණය |
|---|---|---|
| පදවි ශ්‍රීපුර | 10.415 (100%) | 215 |
| ගෝමරන්කඩවල | 5082 (99.5%) | 287.3 |
| මොරවැව | 3181 (82.8%) | 332.5 |
| කන්තලේ | 32.129 (78.7%) | 412.1 |
| සේරුවිල | 6798 (97.1%) | 244.8 |

මුළු ඉඩම් ප්‍රමාණයෙන් 54.7% කි 1491.7


1981 අනුව 1598.8 කි. ගෝමරන්කඩවල, පදවිය කොටස කන්තලේ, සේරුවිල හා මොරවැව යන ප්‍රදේශ සිංහල ප්‍රදේශ විය.

මුළු ප්‍රමාණය 4898. නැගෙනහිර පළාත මුළු භූමි ප්‍රමාණය 9635.3 ව.කි.මී. - 2001 1981 ට වඩා ඇති වෙනස 1982 දී පදවියෙන් කොටසක් එක්වීමත්, සේරුවිල කොට්ඨාශය සේරුවිල හා වේරුගල් ලෙස දෙකට බෙදීමත් අම්පාර සිංහල ප්‍රදේශය කොටස් කිහිපයකට වෙන්වීමත්ය. 1981 දී එය ව.කි.මී. 4989.9ක් විය.

රූපය - අංක 15




රූපය - අංක 16


නැගෙනහිර පළාතේ
සිංහල - මුස්ලිම්
ඒකාබද්ධ ජන ගහණය
2001
95% ට වැඩි
95% - 80% අතර
80% - 65% අතර
65% - 50% අතර
50% ට අඩු



IV වැනි දප්පුල මහරජුගේ (ක්‍රි.ව. 924 - 935) දිගාමඩුල්ලේ (අම්පාරේ) කොන්ඩවට්ටන් ශිලාලිපිය



ක්‍රි.ව. 6 වැනි සියවසට අයත්, සංස්කෘත භාෂාවෙන් රචිත කුච්චවේලි ශිලාලිපිය



තඵස්සු භල්ලුක නම් දෙවෙළෙඳුන් විසින් වැඩමවාගෙන එන ලද සර්වඥ කේශ ධාතු නිදන් කරන ලද තිරියාය ස්තූපය.

ඉදිරිපස ජායාරූපය - ත්‍රිකුණාමලය වරාය දර්ශණය.

පාඨලී චම්පික රණවක
655 ඇල්විටිගල මාවත
කොළඹ 05